# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2012

# ඇගයීම් වාර්තාව

# 33 - ඉතිහාසය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2012

## ඇගයීම් වාර්තාව

# 33 - ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**ඉතිහාසය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2012

## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩ් වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

ඉතිහාසය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මගින් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2013 නොවැම්බර් 11
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | ජේ.ඒ.ජේ.ආර්. ජයකොඩි<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ජේ.ඒ.ජේ.ආර්. ජයකොඩි<br>සහකාර විභාග කොමසාරිස්<br><br>එස්.ඒ.සී. දිසානායක<br>ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>මහරගම<br><br>ආර්.ඒ. චන්ද්‍රසිරි<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>මිනුවන්ගොඩ<br><br>ආර්.පී. ලින්ටන් ධර්මදාස<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>හලාවත |
| **සැකසුම් කමිටුව** | : | කේ.වී.එස්. විජයමාලා<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කැලණිය<br><br>ඩී.ආර්.එස්.එස්.එම්. කුලතුංග<br>සහකාර විදුහල්පති (හිටපු ගුරු උපදේශක)<br>ශාන්ත මරියා විද්‍යාලය,<br>කෑගල්ල<br><br>එම්.ටී. මල්ලිකා ඉන්ද්‍රානි<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>අම්බලන්ගොඩ |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර<br>දත්ත සටහන් ක්‍රියාකරු<br><br>ඩබ්ලිව්.ඒ.ඩී. චතුරිකා දිසානායක<br>දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය


**I කොටස**

1. **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 **විෂය අභිමතාර්ථ** 1

1.2 **විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු**

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 **විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

**II කොටස**

2. **ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 13

2.1.2 I ප්‍රශ්න පත්‍රය 14

2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව 19

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 20

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 23

2.2.2 II ප්‍රශ්න පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 24

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 46

**III කොටස**

3. **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු** 48

3.2 **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා** 49

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

- ★ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විමර්ශනයෙහි යෙදෙයි.
- ★ වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ විමර්ශනාත්මක දැනුම උපයෝගී කර ගනියි.
- ★ ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව විමසා බලමින් කටයුතු කරයි.
- ★ වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන ආදර්ශයට ගෙන කටයුතු කරයි.
- ★ ජාතික අනන්‍යතාව හඳුනාගෙන ඒවා අගය කරමින් චරිතායනය කරයි.
- ★ ඉතිහාසයේ අත්දැකීම් වර්තමාන සංසිද්ධි සඳහා ඵලදායි ලෙස භාවිත කරයි.
- ★ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධති පිළිබඳ අභිමානවත් හැඟුමින් යුක්තව කටයුතු කරයි.
- ★ විචාරශීලී හා විවේචනාත්මක චින්තන සංකල්ප වර්ධනය කර ගනියි.
- ★ ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනාගැනීමේ හැකියාව දියුණු කරයි.

## 1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 227952 | 5449 | 233401 |
| දෙමළ | 63230 | 10849 | 74079 |
| ඉංග්‍රීසි | 6765 | 2970 | 9735 |
| එකතුව | **297947** | **19268** | **317215** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 26555 | 8.91 | 293 | 1.52 | 26848 | 8.46 |
| B | 22578 | 7.58 | 373 | 1.94 | 22951 | 7.24 |
| C | 60142 | 20.19 | 2025 | 10.51 | 62167 | 19.60 |
| S | 85575 | 28.72 | 5879 | 30.51 | 91454 | 28.83 |
| W | 103097 | 34.60 | 10698 | 55.52 | 113795 | 35.87 |
| එකතුව | **297947** | **100.00** | **19268** | **100.00** | **317215** | **100.00** |

වගුව 2

### 1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 30494 | 5641 | 18.50 | 3462 | 11.35 | 7066 | 23.17 | 7173 | 23.52 | 23342 | 76.55 | 7152 | 23.45 |
| 2. ගම්පහ | 25724 | 2899 | 11.27 | 2428 | 9.44 | 5459 | 21.22 | 6851 | 26.63 | 17637 | 68.56 | 8087 | 31.44 |
| 3. කළුතර | 14646 | 1764 | 12.04 | 1419 | 9.69 | 3256 | 22.23 | 3790 | 25.88 | 10229 | 69.84 | 4417 | 30.16 |
| 4. මහනුවර | 19291 | 2044 | 10.60 | 1554 | 8.06 | 4082 | 21.16 | 5140 | 26.64 | 12820 | 66.46 | 6471 | 33.54 |
| 5. මාතලේ | 6424 | 472 | 7.35 | 425 | 6.62 | 1327 | 20.66 | 1809 | 28.16 | 4033 | 62.78 | 2391 | 37.22 |
| 6. නුවරඑළිය | 9145 | 436 | 4.77 | 514 | 5.62 | 1753 | 19.17 | 2619 | 28.64 | 5322 | 58.20 | 3823 | 41.80 |
| 7. ගාල්ල | 15058 | 1704 | 11.32 | 1316 | 8.74 | 3467 | 23.02 | 4142 | 27.51 | 10629 | 70.59 | 4429 | 29.41 |
| 8. මාතර | 11347 | 1374 | 12.11 | 1042 | 9.18 | 2515 | 22.16 | 3058 | 26.95 | 7989 | 70.41 | 3358 | 29.59 |
| 9. හම්බන්තොට | 8735 | 685 | 7.84 | 765 | 8.76 | 1984 | 22.71 | 2541 | 29.09 | 5975 | 68.40 | 2760 | 31.60 |
| 10. යාපනය | 8471 | 760 | 8.97 | 697 | 8.23 | 1803 | 21.28 | 1940 | 22.90 | 5200 | 61.39 | 3271 | 38.61 |
| 11. කිලිනොච්චි | 1699 | 46 | 2.71 | 82 | 4.83 | 255 | 15.01 | 377 | 22.19 | 760 | 44.73 | 939 | 55.27 |
| 12. මන්නාරම | 1480 | 75 | 5.07 | 125 | 8.45 | 352 | 23.78 | 448 | 30.27 | 1000 | 67.57 | 480 | 32.43 |
| 13. වව්නියාව | 2663 | 239 | 8.97 | 222 | 8.34 | 605 | 22.72 | 750 | 28.16 | 1816 | 68.19 | 847 | 31.81 |
| 14. මුලතිව් | 1405 | 36 | 2.56 | 41 | 2.92 | 194 | 13.81 | 343 | 24.41 | 614 | 43.70 | 791 | 56.30 |
| 15. මඩකලපුව | 6637 | 530 | 7.99 | 475 | 7.16 | 1434 | 21.61 | 1956 | 29.47 | 4395 | 66.22 | 2242 | 33.78 |
| 16. අම්පාර | 8832 | 470 | 5.32 | 578 | 6.54 | 1768 | 20.02 | 2807 | 31.78 | 5623 | 63.67 | 3209 | 36.33 |
| 17. ත්‍රිකුණාමලය | 5236 | 296 | 5.65 | 359 | 6.86 | 1007 | 19.23 | 1621 | 30.96 | 3283 | 62.70 | 1953 | 37.30 |
| 18. කුරුණෑගල | 21505 | 1917 | 8.91 | 1831 | 8.51 | 4752 | 22.10 | 6157 | 28.63 | 14657 | 68.16 | 6848 | 31.84 |
| 19. පුත්තලම | 9418 | 705 | 7.49 | 638 | 6.77 | 1854 | 19.69 | 2774 | 29.45 | 5971 | 63.40 | 3447 | 36.60 |
| 20. අනුරාධපුරය | 11703 | 863 | 7.37 | 822 | 7.02 | 2505 | 21.40 | 3547 | 30.31 | 7737 | 66.11 | 3966 | 33.89 |
| 21. පොළොන්නරුව | 5062 | 283 | 5.59 | 312 | 6.16 | 929 | 18.35 | 1474 | 29.12 | 2998 | 59.23 | 2064 | 40.77 |
| 22. බදුල්ල | 12476 | 732 | 5.87 | 868 | 6.96 | 2513 | 20.14 | 3797 | 30.43 | 7910 | 63.40 | 4566 | 36.60 |
| 23. මොනරාගල | 6535 | 306 | 4.68 | 331 | 5.07 | 1181 | 18.07 | 1939 | 29.67 | 3757 | 57.49 | 2778 | 42.51 |
| 24. රත්නපුරය | 14161 | 1224 | 8.64 | 1086 | 7.67 | 2974 | 21.00 | 3956 | 27.94 | 9240 | 65.25 | 4921 | 34.75 |
| 25. කෑගල්ල | 10821 | 1013 | 9.36 | 997 | 9.21 | 2512 | 23.21 | 3197 | 29.54 | 7719 | 71.33 | 3102 | 28.67 |
| **සමස්ත දිවයින** | **268968** | **26514** | **9.86** | **22389** | **8.32** | **57547** | **21.40** | **74206** | **27.59** | **180656** | **67.17** | **88312** | **32.83** |

වගුව 3

## 1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 14280 | 3461 | 24.24 | 1808 | 12.66 | 3206 | 22.45 | 2700 | 18.91 | 11175 | 78.26 | 3105 | 21.74 |
| 2. හෝමාගම | 3566 | 351 | 9.84 | 312 | 8.75 | 793 | 22.24 | 1041 | 29.19 | 2497 | 70.02 | 1069 | 29.98 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 6897 | 1032 | 14.96 | 776 | 11.25 | 1622 | 23.52 | 1863 | 27.01 | 5293 | 76.74 | 1604 | 23.26 |
| 4. පිළියන්දල | 5751 | 797 | 13.86 | 566 | 9.84 | 1445 | 25.13 | 1569 | 27.28 | 4377 | 76.11 | 1374 | 23.89 |
| 5. ගම්පහ | 7402 | 1360 | 18.37 | 828 | 11.19 | 1564 | 21.13 | 1725 | 23.30 | 5477 | 73.99 | 1925 | 26.01 |
| 6 මිනුවන්ගොඩ | 4886 | 343 | 7.02 | 411 | 8.41 | 1009 | 20.65 | 1362 | 27.88 | 3125 | 63.96 | 1761 | 36.04 |
| 7. මීගමුව | 6803 | 596 | 8.76 | 609 | 8.95 | 1436 | 21.11 | 1868 | 27.46 | 4509 | 66.28 | 2294 | 33.72 |
| 8. කැලණිය | 6633 | 600 | 9.05 | 580 | 8.74 | 1450 | 21.86 | 1896 | 28.58 | 4526 | 68.23 | 2107 | 31.77 |
| 9. කළුතර | 7140 | 881 | 12.34 | 637 | 8.92 | 1625 | 22.76 | 1885 | 26.40 | 5028 | 70.42 | 2112 | 29.58 |
| 10. මතුගම | 3029 | 339 | 11.19 | 335 | 11.06 | 661 | 21.82 | 829 | 27.37 | 2164 | 71.44 | 865 | 28.56 |
| 11. හොරණ | 4477 | 544 | 12.15 | 447 | 9.98 | 970 | 21.67 | 1076 | 24.03 | 3037 | 67.84 | 1440 | 32.16 |
| 12. මහනුවර | 6999 | 1486 | 21.23 | 877 | 12.53 | 1761 | 25.16 | 1535 | 21.93 | 5659 | 80.85 | 1340 | 19.15 |
| 13. දෙනුවර | 2026 | 87 | 4.29 | 133 | 6.56 | 369 | 18.21 | 591 | 29.17 | 1180 | 58.24 | 846 | 41.76 |
| 14. ගම්පොල | 3372 | 146 | 4.33 | 159 | 4.72 | 617 | 18.30 | 947 | 28.08 | 1869 | 55.43 | 1503 | 44.57 |
| 15. තෙල්දෙණිය | 1637 | 48 | 2.93 | 61 | 3.73 | 227 | 13.87 | 512 | 31.28 | 848 | 51.80 | 789 | 48.20 |
| 16. වත්තේගම | 2317 | 111 | 4.79 | 145 | 6.26 | 508 | 21.92 | 651 | 28.10 | 1415 | 61.07 | 902 | 38.93 |
| 17. කටුගස්තොට | 2940 | 166 | 5.65 | 179 | 6.09 | 600 | 20.41 | 904 | 30.75 | 1849 | 62.89 | 1091 | 37.11 |
| 18. මාතලේ | 3426 | 362 | 10.57 | 293 | 8.55 | 775 | 22.62 | 927 | 27.06 | 2357 | 68.80 | 1069 | 31.20 |
| 19. ගලේවෙල | 2019 | 71 | 3.52 | 95 | 4.71 | 366 | 18.13 | 614 | 30.41 | 1146 | 56.76 | 873 | 43.24 |
| 20. නාඋල | 467 | 22 | 4.71 | 19 | 4.07 | 100 | 21.41 | 119 | 25.48 | 260 | 55.67 | 207 | 44.33 |
| 21. විල්ගමුව | 512 | 17 | 3.32 | 18 | 3.52 | 86 | 16.80 | 149 | 29.10 | 270 | 52.73 | 242 | 47.27 |
| 22. නුවරඑළිය | 2494 | 60 | 2.41 | 86 | 3.45 | 451 | 18.08 | 758 | 30.39 | 1355 | 54.33 | 1139 | 45.67 |
| 23. කොත්මලේ | 1240 | 76 | 6.13 | 67 | 5.40 | 250 | 20.16 | 358 | 28.87 | 751 | 60.56 | 489 | 39.44 |
| 24. හැටන් | 2579 | 111 | 4.30 | 176 | 6.82 | 538 | 20.86 | 715 | 27.72 | 1540 | 59.71 | 1039 | 40.29 |
| 25. වලපනේ | 1283 | 67 | 5.22 | 77 | 6.00 | 250 | 19.49 | 356 | 27.75 | 750 | 58.46 | 533 | 41.54 |
| 26. හඟුරන්කෙත | 1549 | 122 | 7.88 | 108 | 6.97 | 264 | 17.04 | 432 | 27.89 | 926 | 59.78 | 623 | 40.22 |
| 27. ගාල්ල | 6839 | 1074 | 15.70 | 693 | 10.13 | 1586 | 23.19 | 1746 | 25.53 | 5099 | 74.56 | 1740 | 25.44 |
| 28. ඇල්පිටිය | 3077 | 180 | 5.85 | 221 | 7.18 | 709 | 23.04 | 922 | 29.96 | 2032 | 66.04 | 1045 | 33.96 |
| 29. අම්බලන්ගොඩ | 3416 | 327 | 9.57 | 299 | 8.75 | 817 | 23.92 | 959 | 28.07 | 2402 | 70.32 | 1014 | 29.68 |
| 30. උඩුගම | 1726 | 123 | 7.13 | 103 | 5.97 | 355 | 20.57 | 515 | 29.84 | 1096 | 63.50 | 630 | 36.50 |
| 31. මාතර | 5010 | 915 | 18.26 | 527 | 10.52 | 1155 | 23.05 | 1221 | 24.37 | 3818 | 76.21 | 1192 | 23.79 |
| 32. අකුරැස්ස | 1998 | 208 | 10.41 | 207 | 10.36 | 423 | 21.17 | 528 | 26.43 | 1366 | 68.37 | 632 | 31.63 |
| 33. මුලටියන-හක්මණ | 2098 | 149 | 7.10 | 187 | 8.91 | 496 | 23.64 | 653 | 31.12 | 1485 | 70.78 | 613 | 29.22 |
| 34. මොරවක-දෙනියාය | 2241 | 102 | 4.55 | 121 | 5.40 | 441 | 19.68 | 656 | 29.27 | 1320 | 58.90 | 921 | 41.10 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 2444 | 186 | 7.61 | 235 | 9.62 | 602 | 24.63 | 723 | 29.58 | 1746 | 71.44 | 698 | 28.56 |
| 36. හම්බන්තොට | 3799 | 203 | 5.34 | 250 | 6.58 | 790 | 20.79 | 1160 | 30.53 | 2403 | 63.25 | 1396 | 36.75 |
| 37. වලස්මුල්ල | 2492 | 296 | 11.88 | 280 | 11.24 | 592 | 23.76 | 658 | 26.40 | 1826 | 73.27 | 666 | 26.73 |
| 38. යාපනය | 3094 | 398 | 12.86 | 319 | 10.31 | 707 | 22.85 | 657 | 21.23 | 2081 | 67.26 | 1013 | 32.74 |
| 39. දූපත් | 578 | 13 | 2.25 | 23 | 3.98 | 77 | 13.32 | 130 | 22.49 | 243 | 42.04 | 335 | 57.96 |
| 40. තෙන්මාරච්චි | 963 | 49 | 5.09 | 75 | 7.79 | 192 | 19.94 | 226 | 23.47 | 542 | 56.28 | 421 | 43.72 |
| 41. වලිකාමන් | 2248 | 137 | 6.09 | 140 | 6.23 | 473 | 21.04 | 569 | 25.31 | 1319 | 58.67 | 929 | 41.33 |
| 42. වඩමරච්චි | 1588 | 163 | 10.26 | 140 | 8.82 | 354 | 22.29 | 358 | 22.54 | 1015 | 63.92 | 573 | 36.08 |
| 43. කිලිනොච්චි | 1699 | 46 | 2.71 | 82 | 4.83 | 255 | 15.01 | 377 | 22.19 | 760 | 44.73 | 939 | 55.27 |
| 44. මන්නාරම | 1213 | 71 | 5.85 | 117 | 9.65 | 307 | 25.31 | 356 | 29.35 | 851 | 70.16 | 362 | 29.84 |
| 45. මඩු | 267 | 4 | 1.50 | 8 | 3.00 | 45 | 16.85 | 92 | 34.46 | 149 | 55.81 | 118 | 44.19 |
| 46. වව්නියාව දකුණ | 2093 | 219 | 10.46 | 184 | 8.79 | 492 | 23.51 | 565 | 26.99 | 1460 | 69.76 | 633 | 30.24 |
| 47. වව්නියාව උතුර | 570 | 20 | 3.51 | 38 | 6.67 | 113 | 19.82 | 185 | 32.46 | 356 | 62.46 | 214 | 37.54 |
| 48. මුලතිව් | 912 | 28 | 3.07 | 25 | 2.74 | 128 | 14.04 | 211 | 23.14 | 392 | 42.98 | 520 | 57.02 |
| 49. තුනුක්කායි | 493 | 8 | 1.62 | 16 | 3.25 | 66 | 13.39 | 132 | 26.77 | 222 | 45.03 | 271 | 54.97 |
| 50. මඩකලපුව | 2141 | 225 | 10.51 | 166 | 7.75 | 470 | 21.95 | 568 | 26.53 | 1429 | 66.74 | 712 | 33.26 |
| 51. කල්කුඩා | 1145 | 32 | 2.79 | 48 | 4.19 | 196 | 17.12 | 370 | 32.31 | 646 | 56.42 | 499 | 43.58 |
| 52. පදිරිප්පු | 1346 | 70 | 5.20 | 82 | 6.09 | 267 | 19.84 | 375 | 27.86 | 794 | 58.99 | 552 | 41.01 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 1336 | 196 | 14.67 | 161 | 12.05 | 410 | 30.69 | 406 | 30.39 | 1173 | 87.80 | 163 | 12.20 |
| 54. මඩකලපුව (බටහිර) | 669 | 7 | 1.05 | 18 | 2.69 | 91 | 13.60 | 237 | 35.43 | 353 | 52.77 | 316 | 47.23 |
| 55. අම්පාර | 2230 | 119 | 5.34 | 152 | 6.82 | 526 | 23.59 | 757 | 33.95 | 1554 | 69.69 | 676 | 30.31 |
| 56. කල්මුනේ | 2149 | 178 | 8.28 | 192 | 8.93 | 454 | 21.13 | 638 | 29.69 | 1462 | 68.03 | 687 | 31.97 |
| 57. සමන්තුරෙයි | 1150 | 38 | 3.30 | 47 | 4.09 | 190 | 16.52 | 327 | 28.43 | 602 | 52.35 | 548 | 47.65 |
| 58. මහඔය | 583 | 11 | 1.89 | 25 | 4.29 | 100 | 17.15 | 198 | 33.96 | 334 | 57.29 | 249 | 42.71 |
| 59. දෙහිඅත්තකණ්ඩිය | 1010 | 61 | 6.04 | 65 | 6.44 | 188 | 18.61 | 310 | 30.69 | 624 | 61.78 | 386 | 38.22 |
| 60. අක්කරෙයිපත්තුව | 988 | 39 | 3.95 | 58 | 5.87 | 192 | 19.43 | 360 | 36.44 | 649 | 65.69 | 339 | 34.31 |
| 61. තිරුක්කෝවිල් | 722 | 24 | 3.32 | 39 | 5.40 | 118 | 16.34 | 217 | 30.06 | 398 | 55.12 | 324 | 44.88 |
| 62. ත්‍රිකුණාමලය | 1813 | 178 | 9.82 | 161 | 8.88 | 389 | 21.46 | 518 | 28.57 | 1246 | 68.73 | 567 | 31.27 |
| 63. මුතූර් | 1074 | 54 | 5.03 | 63 | 5.87 | 175 | 16.29 | 326 | 30.35 | 618 | 57.54 | 456 | 42.46 |
| 64. කන්තලේ | 849 | 23 | 2.71 | 59 | 6.95 | 178 | 20.97 | 282 | 33.22 | 542 | 63.84 | 307 | 36.16 |
| 65. කින්නියා | 1014 | 34 | 3.35 | 56 | 5.52 | 203 | 20.02 | 341 | 33.63 | 634 | 62.52 | 380 | 37.48 |
| 66. ත්‍රිකුණාමලය (උතුර) | 486 | 7 | 1.44 | 20 | 4.12 | 62 | 12.76 | 154 | 31.69 | 243 | 50.00 | 243 | 50.00 |
| 67. කුරුණෑගල | 5331 | 651 | 12.21 | 531 | 9.96 | 1190 | 22.32 | 1436 | 26.94 | 3808 | 71.43 | 1523 | 28.57 |
| 68. කුලියාපිටිය | 3723 | 417 | 11.20 | 325 | 8.73 | 866 | 23.26 | 1040 | 27.93 | 2648 | 71.13 | 1075 | 28.87 |
| 69. නිකවැරටිය | 2785 | 180 | 6.46 | 235 | 8.44 | 654 | 23.48 | 850 | 30.52 | 1919 | 68.90 | 866 | 31.10 |
| 70. මහව | 3259 | 167 | 5.12 | 198 | 6.08 | 638 | 19.58 | 1039 | 31.88 | 2042 | 62.66 | 1217 | 37.34 |
| 71. ගිරිඋල්ල | 3626 | 256 | 7.06 | 307 | 8.47 | 859 | 23.69 | 1007 | 27.77 | 2429 | 66.99 | 1197 | 33.01 |
| 72. ඉබ්බාගමුව | 2781 | 246 | 8.85 | 235 | 8.45 | 545 | 19.60 | 785 | 28.23 | 1811 | 65.12 | 970 | 34.88 |
| 73. පුත්තලම | 4493 | 205 | 4.56 | 222 | 4.94 | 785 | 17.47 | 1400 | 31.16 | 2612 | 58.13 | 1881 | 41.87 |
| 74. හලාවත | 4925 | 500 | 10.15 | 416 | 8.45 | 1069 | 21.71 | 1374 | 27.90 | 3359 | 68.20 | 1566 | 31.80 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 75. අනුරාධපුරය | 4170 | 506 | 12.13 | 394 | 9.45 | 983 | 23.57 | 1100 | 26.38 | 2983 | 71.53 | 1187 | 28.47 |
| 76. තඹුත්තේගම | 1972 | 81 | 4.11 | 130 | 6.59 | 398 | 20.18 | 646 | 32.76 | 1255 | 63.64 | 717 | 36.36 |
| 77. කැකිරාව | 2271 | 159 | 7.00 | 148 | 6.52 | 505 | 22.24 | 717 | 31.57 | 1529 | 67.33 | 742 | 32.67 |
| 78. ගලෙන්බිඳුනුවැව | 1565 | 54 | 3.45 | 72 | 4.60 | 307 | 19.62 | 527 | 33.67 | 960 | 61.34 | 605 | 38.66 |
| 79. කැබිතිගොල්ලෑව | 1725 | 63 | 3.65 | 78 | 4.52 | 312 | 18.09 | 557 | 32.29 | 1010 | 58.55 | 715 | 41.45 |
| 80. පොළොන්නරුව | 1572 | 122 | 7.76 | 112 | 7.12 | 313 | 19.91 | 433 | 27.54 | 980 | 62.34 | 592 | 37.66 |
| 81. හිඟුරක්ගොඩ | 2051 | 121 | 5.90 | 134 | 6.53 | 372 | 18.14 | 555 | 27.06 | 1182 | 57.63 | 869 | 42.37 |
| 82. දිඹුලාගල | 1439 | 40 | 2.78 | 66 | 4.59 | 244 | 16.96 | 486 | 33.77 | 836 | 58.10 | 603 | 41.90 |
| 83. බදුල්ල | 3576 | 258 | 7.21 | 275 | 7.69 | 733 | 20.50 | 1081 | 30.23 | 2347 | 65.63 | 1229 | 34.37 |
| 84. බණ්ඩාරවෙල | 3210 | 282 | 8.79 | 266 | 8.29 | 733 | 22.83 | 945 | 29.44 | 2226 | 69.35 | 984 | 30.65 |
| 85. මහියංගනය | 2003 | 80 | 3.99 | 110 | 5.49 | 337 | 16.82 | 625 | 31.20 | 1152 | 57.51 | 851 | 42.49 |
| 86. වැලිමඩ | 2663 | 84 | 3.15 | 156 | 5.86 | 522 | 19.60 | 855 | 32.11 | 1617 | 60.72 | 1046 | 39.28 |
| 87. පස්සර | 1024 | 28 | 2.73 | 61 | 5.96 | 188 | 18.36 | 291 | 28.42 | 568 | 55.47 | 456 | 44.53 |
| 88. මොනරාගල | 2181 | 108 | 4.95 | 111 | 5.09 | 396 | 18.16 | 637 | 29.21 | 1252 | 57.40 | 929 | 42.60 |
| 89. වැල්ලවාය | 2804 | 105 | 3.74 | 141 | 5.03 | 501 | 17.87 | 847 | 30.21 | 1594 | 56.85 | 1210 | 43.15 |
| 90. බිබිල | 1550 | 93 | 6.00 | 79 | 5.10 | 284 | 18.32 | 455 | 29.35 | 911 | 58.77 | 639 | 41.23 |
| 91. රත්නපුර | 5969 | 749 | 12.55 | 549 | 9.20 | 1323 | 22.16 | 1487 | 24.91 | 4108 | 68.82 | 1861 | 31.18 |
| 92. බළන්ගොඩ | 2563 | 190 | 7.41 | 203 | 7.92 | 520 | 20.29 | 710 | 27.70 | 1623 | 63.32 | 940 | 36.68 |
| 93. නිවිතිගල | 2285 | 77 | 3.37 | 122 | 5.34 | 485 | 21.23 | 747 | 32.69 | 1431 | 62.63 | 854 | 37.37 |
| 94. ඇඹිලිපිටිය | 3344 | 208 | 6.22 | 212 | 6.34 | 646 | 19.32 | 1012 | 30.26 | 2078 | 62.14 | 1266 | 37.86 |
| 95. කෑගල්ල | 4179 | 562 | 13.45 | 468 | 11.20 | 999 | 23.91 | 1177 | 28.16 | 3206 | 76.72 | 973 | 23.28 |
| 96. මාවනැල්ල | 3373 | 240 | 7.12 | 272 | 8.06 | 789 | 23.39 | 983 | 29.14 | 2284 | 67.71 | 1089 | 32.29 |
| 97. දෙහිඕවිට | 3269 | 211 | 6.45 | 257 | 7.86 | 724 | 22.15 | 1037 | 31.72 | 2229 | 68.19 | 1040 | 31.81 |
| **සමස්ත දිවයින** | 268968 | 26514 | 9.86 | 22389 | 8.32 | 57547 | 21.40 | 74206 | 27.59 | 180656 | 67.17 | 88312 | 32.83 |

වගුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 1020 | 0.32 | 317215 | 100.00 |
| 81 - 90 | 9279 | 2.92 | 316195 | 99.68 |
| 71 - 80 | 18834 | 5.93 | 306916 | 96.75 |
| 61 - 70 | 24921 | 7.85 | 288082 | 90.82 |
| 51 - 60 | 36263 | 11.43 | 263161 | 82.96 |
| 41 - 50 | 48746 | 15.36 | 226898 | 71.53 |
| 31 - 40 | 70890 | 22.34 | 178152 | 56.16 |
| 21 - 30 | 71873 | 22.65 | 107262 | 33.81 |
| 11 - 20 | 32941 | 10.38 | 35389 | 11.16 |
| 01 - 10 | 2431 | 0.76 | 2448 | 0.77 |
| 00 - 00 | 17 | 0.05 | 17 | 0.01 |

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (31 - 40 පංති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 70890කි. එය ප්‍රතිශතයක් වශයෙන් 22.34%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 178152ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 56.16%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 25 ප්‍රශ්නයට ය. එහි පහසුතාව 74%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 18 ප්‍රශ්නයට ය. එහි පහසුතාව 12%කි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි 1 ප්‍රශ්නය අනිවාර්ය වුව ද සුළු පිරිසක් එය තෝරාගෙන නැත. එයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 99%කි. අඩුම ප්‍රතිශතයක් තෝරාගෙන ඇත්තේ 10 ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 32%කි.

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.


උදා:- මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 30කි. එම ලකුණුවලින් 76 - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 23 - 30 තෙක් ලබාගත් ප්‍රතිශතය 3%කි. එමෙන්ම ලකුණුවලින් 0 - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 - 7 තෙක් ලබා ගත් ප්‍රතිශතය 39%කි.

1.3.4 **II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2012**

**33 - ඉතිහාසය**

**II පත්‍රයේ පළමුවන ප්‍රශ්නයේ කොටස්වල පහසුතා දර්ශකය**





ප්‍රස්තාරය 4.1 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.


උදා:- 1 ප්‍රශ්නයෙහි (ආ) (i) *A* අනුකොටසෙහි පහසුතාව 88%ක් වන අතර එම ප්‍රශ්නයේ (ආ) (ii) 4 කොටසෙහි පහසුතාව 15%ක් පමණි.

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2012**
**33 - ඉතිහාසය**
**II පත්‍රයේ ප්‍රශ්නවල එක් එක් කොටසෙහි පහසුතා දර්ශකය**




ප්‍රස්තාරය 4.2

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2012**
**33 - ඉතිහාසය**
**II පත්‍රයේ ප්‍රශ්නවල එක් එක් කොටසෙහි පහසුතා දර්ශකය**




ප්‍රස්තාරය 4.3

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 01යි. මුළු ලකුණු 40කි.**

- ⋆ වරණ හතරක් සහිත බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්ෂා කෙරේ.
- ⋆ සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන පරිදි ප්‍රශ්න සකස් කර ඇත.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. 'වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම් ගත යුතු ය.'
ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන දක්වෙන ඉහත සඳහන් ප්‍රකාශය කවරකු විසින් කරන ලද්දේ ද ?
(1) ජී. එම්. ට්‍රෙවිලියන් (2) ශ්‍රී ජවහර්ලාල් නේරු (3) ඊ. එච්. කාර් (4) ඇරිස්ටෝටල්

2. අතීත ශ්‍රී ලංකාව පිළිබඳ ව වඩාත් නිවැරදි තොරතුරු දක්වීමට හැකි වූ විදේශිකයා ලෙස සැලකිය හැක්කේ කවරෙක් ද ?
(1) මෙගස්තිනීස් (2) ප්ලිනි (3) ඉබන් බතූතා (4) ක්ලෝඩියස් ටොලමි

3. 'ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී ඓතිහාසික මූලාශ්‍රය ලෙස සෙල්ලිපිවලට වැදගත් ස්ථානයක් හිමි වේ.'
ඉහත ප්‍රකාශය හා **නොගැළපෙන** වගන්තිය මින් කුමක් ද ?
(1) සෙල්ලිපි මගින් ශ්‍රී ලංකාවේ අඛණ්ඩ දේශපාලන ඉතිහාසය ගොඩනගාගත හැකි වේ.
(2) සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් කරුණු සෙල්ලිපි මගින් තහවුරු වේ.
(3) සෙල්ලිපිවල අන්තර්ගත කරුණු අදාළ සිද්ධීන්ට සමකාලීන වේ.
(4) ශ්‍රී ලංකාවේ පැවැති වෙළෙඳ හා අධිකරණ කටයුතු පිළිබඳ තොරතුරු සෙල්ලිපි මගින් හෙළි වේ.

4. දුටුගැමුණු රජතුමාගේ දසමහා යෝධයන් පිළිබඳ ඇතැම් තොරතුරු අඩංගු ශිලාලිපි හමු වූ ස්ථාන දෙකක් සඳහන් වන පිළිතුර මින් කුමක් ද ?
(1) ගඩලාදෙණිය, මිහින්තලේ (2) සිතුල්පව්ව, සංඛපාල විහාරය
(3) තෝනිගල, වෙස්සගිරිය (4) රිටිගල, ගොඩවාය

5. ඉන්දියාවේ ජනාවාස පිහිටුවාගත් මුල් ආර්යයන්ගේ පාලන සංවිධානයේ විශේෂ ලක්ෂණයක් වූයේ,
(1) ගෝත්‍ර වශයෙන් බෙදී කටයුතු කිරීමයි. (2) ස්වභාව ධර්මය දේවත්වයෙහි ලා කටයුතු කිරීමයි.
(3) කෘෂිකාර්මික කටයුතුවලට මුල්තැනක් දීමයි. (4) හමුද ශක්තිය මත ගොඩනැඟුණු පාලනයක් වීමයි.

6. විජයනගර් අධිරාජ්‍යයේ පාලකයන් අතින් ඉටු වූ වැදගත් ම සේවාව ලෙස සැලකිය හැක්කේ,
(1) තෙළිඟු සාහිත්‍යයේ උන්නතියට කටයුතු කිරීමයි.
(2) හින්දු ගෘහ නිර්මාණ ශිල්පය උච්ඡතම අවස්ථාවට පත් කිරීමට කටයුතු කිරීමයි.
(3) බහමනි මුස්ලිම් රාජ්‍යය සමඟ දිගුකාලීන අරගලයක නිරත වීමයි.
(4) දකුණු ඉන්දියාවේ හින්දු සංස්කෘතිය මුස්ලිම් බලයට යටත්වීමට ඉඩ නොදී පවත්වා ගැනීමයි.

7. වයඹ දිග ඉන්දියානු ප්‍රදේශයට වරින්වර පැමිණි මුල් ම මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ,
(1) ඉන්දියාවේ ධනය කොල්ල කා ආපසු යෑම ය. (2) තම ආගම ප්‍රචාරය කිරීම ය.
(3) එම ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීම ය. (4) ප්‍රදේශ අල්ලාගෙන අධිරාජ්‍යයක් පිහිටුවා ගැනීම ය.

8. සීගිරි නගර සංකීර්ණයේ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ,
(1) නගරයේ ආරක්ෂාව සඳහා වැඩි අවධානයක් යොමු කර තිබීමයි.
(2) ආගමික සිද්ධස්ථාන සඳහා නගරය තුළ ඉඩකඩ වෙන් කර තිබීමයි.
(3) පරිසරය රැකෙන පරිදි නගරය සැලසුම් කර තිබීමයි.
(4) කලා නිර්මාණ සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී තිබීමයි.

9. පහත I තීරුවේ දක්වෙනුයේ අනුරාධපුර යුගයේ පැවැති තනතුරු කිහිපයකි. එම තනතුරුවලට අදළ කාර්යයන් II තීරුවේ දක්වේ. I තීරුව II තීරුව හා ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද ?

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) ඇපා | *A.* ගම පාලනය කිරීම |
| (ii) මාපා | *B.* දක්ඛිණ දේශය පාලනය කිරීම |
| (iii) බඩගරික | *C.* රුහුණු දේශය පාලනය කිරීම |
| (iv) ගමික | *D.* රජතුමාට අනුශාසනා කිරීම |
| | *E.* රාජ්‍ය භාණ්ඩාගාරය භාරව කටයුතු කිරීම |

(1) *ABCD* (2) *BCDA* (3) *CBEA* (4) *CDBA*

10. අනුරාධපුර යුගයේ අග භාගය වන විට ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර පැවැති සම්බන්ධතාවල කැපී පෙනෙන ලක්ෂණය වූයේ, ඒවා
   (1) බොහොමයක් ආක්‍රමණ ස්වරූපයෙන් ක්‍රියාත්මක වීම ය.
   (2) වාණිජ පදනමකින් ක්‍රියාත්මක වීම ය.
   (3) ආගමික හා සංස්කෘතික ස්වරූපයක් ගැනීම ය.
   (4) බොහොමයක් සංක්‍රමණ ස්වරූපයෙන් ක්‍රියාත්මක වීම ය.

11. පහත දක්වෙනුයේ ශ්‍රී ලංකාවට එල්ල වූ විදේශ ආක්‍රමණ කිහිපයකි. ඒවා අතුරෙන් **ඉන්දියානු නොවන** ආක්‍රමණ ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) තුන්වන ක්‍රිෂ්ණ - දෙවන පරන්තක
   (2) චන්ද්‍රභානු - චෙන් හෝ
   (3) සේන, ගුත්තික - එළාර
   (4) පළමුවන රාජ රාජ - මාඝ

12. ශ්‍රී ලංකාවට විදේශ ආක්‍රමණ එල්ල වූ අවස්ථාවල දී මලය රට වඩාත් වැදගත් වූයේ, පහත සඳහන් කවර කරුණක් සඳහා ද ?
   (1) යුද පෙරමුණුවලට ආහාර සැපයීම
   (2) රැකවරණය ලබාගැනීම
   (3) යුද අවි නිපදවීම
   (4) අතිරේක සේනා ලබා ගැනීම

13. අනුරාධපුර පොළොන්නරු යුගවල දී ශ්‍රී ලංකාවේ පැවැති ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණය වූයේ,
   (1) මුදල් භාවිතය ප්‍රචලිතව තිබීමයි.
   (2) අසල්වැසි රටවල් සමඟ පමණක් වෙළෙඳ ගනුදෙනු කිරීමයි.
   (3) පෙර අපර දෙදිග වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමයි.
   (4) අරාබි ජාතික වෙළෙඳුන් මෙරට වෙළෙඳ කටයුතු මෙහෙයවීමයි.

14. පහත ඓතිහාසික සිදුවීම් අතුරෙන් සීගිරි කාශ්‍යප රාජ්‍ය සමයේ ලංකාවට පැමිණි වෙළෙන්දකුට අසන්නට **නොලැබෙන** සිද්ධීන් ඇතුළත් පිළිතුර කුමක් ද ?
   *A* – භික්ෂුණී ශාසනය පිහිටුවීම
   *B* – අභයගිරි විහාරය ඉදිකිරීම
   *C* – දෙවන පරාක්‍රමබාහු දඹදෙණියේ රජවීම
   *D* – පස්වන මිහිඳු රජු සිරකරුවකු ලෙස චෝළ දේශයට ගෙන යාම
   *E* – පණ්ඩු, පාරින්ද ඇතුළු පිරිස ලංකාව ආක්‍රමණය කිරීම
   *F* – පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම
   (1) *C*, *D* හා *F*   (2) *A*, *C* හා *D*   (3) *B*, *D* හා *F*   (4) *C*, *E* හා *F*

15. සීගිරිය, අනුරාධපුරය, පොළොන්නරුව, මහනුවර වැනි ස්ථාන ජාතික උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කර ඇත්තේ,
   (1) ඒවා දේශීය සංස්කෘතියේ අභිමානවත් බව හා විශිෂ්ටත්වය පිළිබිඹු කෙරෙන ස්ථාන වීම නිසා ය.
   (2) විදේශීය සංචාරකයන් වැඩි දෙනකු නැරඹීමට පැමිණෙන ස්ථාන වීම නිසා ය.
   (3) එම ස්ථාන ශ්‍රී ලංකාවේ පැරණි පාලන මධ්‍යස්ථාන වීම නිසා ය.
   (4) එම ස්ථානවල සිදු කෙරෙන පුරා විද්‍යාත්මක ගවේෂණ කටයුතුවලට පහසුවක් වන නිසා ය.

16. පොළොන්නරුවේ බලය අත්පත් කර ගැනීම සඳහා ඇති වූ ගැටුම්වල දී දෙවන ගජබාහු හා පළමුවන පරාක්‍රමබාහු යන පාලකයන් අතර ඇතිකරගත් ගිවිසුමක් පිළිබඳ සඳහන් වන්නේ,
   (1) ගල්පොත ශිලා ලිපියෙහි ය.
   (2) පනාකඩුව තඹ සන්නසෙහි ය.
   (3) අඹගමුව ශිලා ලිපියෙහි ය.
   (4) සංගමු විහාර ශිලා ලිපියෙහි ය.

17. පහත I තීරුවෙහි ඇති ඓතිහාසික සිදුවීම්වල අනුපිළිවෙළට II තීරුවේ ඇති රජවරුන්ගේ නම් ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද ?

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) – ලක්දිව ග්‍රාම සීමා නියම කිරීම | *E* – වසභ |
| (ii) – බුරුම දේශය ආක්‍රමණය කිරීම | *F* – පණ්ඩුකාභය |
| (iii) – චන්ද්‍රභානුගේ ලංකා ආක්‍රමණය | *G* – පළමුවන පරාක්‍රමබාහු |
| (iv) – 'සිංහලසංගය' නම් වූ කැරැල්ලක් මර්දනය කිරීම | *H* – දෙවැනි පරාක්‍රමබාහු |
| | *I* – හයවන බුවනෙකබාහු |
| | *J* – හතරවන පරාක්‍රමබාහු |

   (1) *EGHJ*   (2) *FIGJ*   (3) *FGHI*   (4) *EIJG*

18. ඉන්දියාවේ මුස්ලිම් බලය තහවුරුවීම කෙරෙහි වඩාත් බලපෑ ආක්‍රමණය මෙහෙයවන ලද්දේ කවරකු විසින් ද ?
(1) මොහොමඩ් බින් කාසිම් (2) ඝස්නි මහමුද්
(3) ඝූර් මුහම්මද් (4) බාබූර්

19. කෝට්ටේ ආරක්ෂිත බලකොටුවක් ලෙස ඉදිකරන ලද්දේ,
(1) වීර අලකේශ්වර විසිනි. (2) හයවැනි පරාක්‍රමබාහු විසිනි.
(3) සේනාලංකාධිකාර සෙනෙවිරත් විසිනි. (4) නිශ්ශංක අලගක්කෝනාර ඇමති විසිනි.

20. යුරෝපීයයන් පෙරදිගට පැමිණීමට නව මුහුදු මාර්ග සෙවීම සඳහා උනන්දු වීම කෙරෙහි බලපෑ ප්‍රධානම හේතුව වූයේ,
(1) නාවික ගමන්වල සුරක්ෂිතව යෙදීමට උපකාරී වූ මාලිමා යන්ත්‍රය සොයා ගැනීමයි.
(2) කොන්ස්තන්තිනෝපලය අල්වා ගත් තුර්කි මුස්ලිම්වරු යුරෝපය හා ආසියාව අතර පැවැති වෙළෙඳාමට බාධා පැමිණවීමයි.
(3) අලුතෙන් බිහි වූ ජාතික රාජ්‍යවල පාලකයන් නව මුහුදු මාර්ග සෙවීම සඳහා අනුග්‍රහය දක්වීමයි.
(4) ක්‍රිස්තු ධර්මය ව්‍යාප්ත කොට එවකට සිදුවෙමින් පැවැති ඉස්ලාම් ධර්ම ව්‍යාප්තිය වැළැක්වීමේ අවශ්‍යතාවයි.

21. 16 වැනි සියවසේ ඇමෙරිකානු මහාද්වීප දෙකට අයත් ප්‍රදේශ වැඩි ගණනක බලය ව්‍යාප්ත කර ගැනීමට හැකි වූ යුරෝපීය රාජ්‍යය වූයේ,
(1) ස්පාඤ්ඤයයි. (2) ප්‍රංසයයි. (3) පෘතුගාලයයි. (4) ඕලන්දයයි.

22. මාටින් ලූතර්, ජෝන් කැල්වින්, උල්රිච් ස්විංග්ලි යන පුද්ගලයන් වැදගත් වන්නේ පහත සඳහන් කවර කරුණක් සම්බන්ධයෙන් ද ?
(1) දේශ ගවේෂණ ගමන්වලට අනුග්‍රහය දැක්වීම
(2) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාර සඳහා මූලිකත්වය ගැනීම
(3) මධ්‍යතන යුගයේ යුරෝපයේ ජාතික රාජ්‍ය සංකල්පය ප්‍රචලිත කිරීම
(4) යුරෝපයේ මධ්‍යතන යුගයේ වැඩවසම් සමාජ ක්‍රමයට විරුද්ධව අදහස් පළ කිරීම

23. කාර්මික විප්ලවය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 18 වැනි සියවසේ එංගලන්තයෙන් ආරම්භ වී 19 වැනි සියවස අවසන් වන විට නිමාවට පත් විය.
(2) යටත් විජිත පිහිටුවා ගත් රටවලට පමණක් සීමා වූ ක්‍රියාවලියක් විය.
(3) කාර්මික විප්ලවයේ බලපෑම දක්නට ඇත්තේ සීමිත කර්මාන්ත ක්ෂේත්‍ර කිහිපයක පමණි.
(4) කාර්මික විප්ලවය තවමත් ලොව පුරා අඛණ්ඩව සිදුවෙමින් පවතින ක්‍රියාවලියකි.

24. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ මූලිකත්වය ගත් නායකයකු වූයේ,
(1) වික්ටර් එමානුවෙල් ය. (2) කැමිලෝ කැවූර් ය. (3) ජෝසප් මැසිනි ය. (4) ඔටෝ වොන් බිස්මාර්ක් ය.

25. 'ජෙසියා' බද්ද අහෝසි කිරීම හා 'මන්සද්දර්' ක්‍රමය හඳුන්වාදීම යන ප්‍රතිපත්ති කිනම් ඉන්දියානු පාලකයකුගේ රාජ්‍ය පාලන සමයක දී ක්‍රියාත්මක වී ද ?
(1) ඖරන් ෂේබ් (2) මහා අක්බාර් (3) ජෙහාන්ගීර් (4) ෂා ජෙහාන්

26. මහනුවර රාජ්‍යයේ තම බලය පිහිටුවීම සඳහා පෘතුගීසීන් අනුගමනය කළ උපාය මාර්ගය වූයේ,
(1) කොනප්පු බණ්ඩාරට රජකම ලබාදීමයි.
(2) කුසුමාසන දේවිය තම රැකවරණය යටතේ රජකරවීමයි.
(3) උඩරට රාජ්‍යය තුළ කතෝලික ආගම ප්‍රචාරය කිරීමයි.
(4) උඩරට රදළ ප්‍රධානීන්ගේ සහාය ලබා ගැනීමයි.

27. ක්‍රි.ව. 1815 දී ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍යය අල්ලා ගැනීමට උපකාරී වූ ප්‍රධානම සාධකය වූයේ,
(1) නායක්කර් වංශයේ රදළයන්ට විශේෂ වරප්‍රසාද ලබා දීමයි.
(2) සිංහල රදළ ප්‍රධානීන්ගේ වරප්‍රසාද අහිමි කිරීමයි.
(3) රදළ ප්‍රධානීන් සහ ජනතාව තුළ තිබූ රාජපාක්ෂික බව හීනවීමයි.
(4) උඩරට පාලකයා විසින් ඉතා අමානුෂික වූ දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීමයි.

28. තම ජාතිය නිර්මල ආර්යයන්ගෙන් පැවත එන ලොව ඉතා උතුම් මානව වර්ගයක් බව පවසමින් ජර්මානුවන් ගොඩනගාගත් දේශපාලන දර්ශනය නම්,
(1) පැසිස්ට්වාදයයි. (2) උපයෝගිතාවාදයයි. (3) මානවවාදයයි. (4) නාසිවාදයයි.

29. ක්‍රි.ව. 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයෙන් පසු මෙරට බ්‍රිතාන්‍ය පාලකයන් විසින් බහුතර ජනතාවගේ සුභසිද්ධිය උදෙසා ගත් පියවර කුමක් ද ?
(1) උඩරට ප්‍රදේශයේ මහාමාර්ග ඉදිකිරීම (2) ඉංග්‍රීසි අධ්‍යාපනයට ඉඩ ප්‍රස්ථා සැලසීම
(3) ගැමි කෘෂිකර්මය නැංවීමට පියවර ගැනීම (4) දේශීය ධනවතුන්ට ව්‍යාපාරවල යෙදීමට ඉඩකඩ සැලසීම

30. ශ්‍රී ලංකාවේ මධ්‍යම පන්තියක් බිහිවීමට සුදුසු වාතාවරණයක් සලසා දෙන ලද්දේ පහත සඳහන් කවර ආණ්ඩුක්‍රම ප්‍රති සංස්කරණය මගින් ද ?
(1) ක්‍රි.ව. 1833 කෝල්බෲක් - කැමරන් (2) ක්‍රි.ව. 1910 ක්‍රෘව් - මැකලම්
(3) ක්‍රි.ව. 1920 මැනිං (4) ක්‍රි.ව. 1931 ඩොනමෝර්

31. එංගලන්තයේ මහරැජින ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායිකාව ලෙස ධුරය දැරීම අවසන් වූයේ
(1) ක්‍රි.ව. 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව මගිනි. (2) ක්‍රි.ව. 1947 සෝල්බරි ව්‍යවස්ථාව මගිනි.
(3) ක්‍රි.ව. 1972 පළමුවන ජනරජ ව්‍යවස්ථාව මගිනි. (4) ක්‍රි.ව. 1977 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගිනි.

32. චීනයේ සාර්ථක ලෙස විප්ලවය කරන්නේ ගොවි ජනතාව බව පැවසූ තැනැත්තා මින්. කවරෙක් ද ?
(1) සුන්-යත්-සෙන් (2) චෞ-එන්-ලායි (3) යුවාං-ෂි-කායි (4) මාඕ-සේතුං

33. හෙන්රි ස්ටීල් ඕල්කට්, අනගාරික ධර්මපාල, වලිසිංහ හරිස්චන්ද්‍ර, ඩී.බී. ජයතිලක යන පුද්ගලයන්ගේ කටයුතුවල පොදු ලක්ෂණය වන්නේ,
(1) පාසල් පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීමයි.
(2) ශ්‍රී ලංකාවේ අතීත ශ්‍රී විභූතිය ලොවට පහදාදීමට කටයුතු කිරීමයි.
(3) අමද්‍යප ව්‍යාපාරයේ පුරෝගාමීන් ලෙස කටයුතු කිරීමයි.
(4) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නායකත්වය දැරීමයි.

34. සෝල්බරි ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය පත්කිරීමේ දී සෙනෙට් සභාවෙන් තෝරා ගත් මන්ත්‍රීවරයකුට අනිවාර්යයෙන් ම පැවරිය යුතු වූ අමාත්‍යාංශය කුමක් ද ?
(1) ආරක්ෂක (2) මුදල් (3) අධිකරණ (4) විදේශ කටයුතු

35. ජනතාව සෘජුව ම ව්‍යවස්ථා සම්පාදනයට සහභාගි වන අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද ?
(1) ජනාධිපතිවරණය (2) පාර්ලිමේන්තු මැතිවරණය
(3) ජනමත විචාරණය (4) පළාත් සභා මැතිවරණය

36. පාර්ලිමේන්තු පනත් කෙටුම්පතක් ව්‍යවස්ථාවට අනුකූලවේදැයි තීරණය කිරීමේ බලය හිමිවන අධිකරණය වන්නේ,
(1) මහේස්ත්‍රාත් අධිකරණයයි. (2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) අභියාචනාධිකරණයයි. (4) මහාධිකරණයයි.

37. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවලට හිමි විශේෂ වරප්‍රසාදය වන්නේ,
(1) අවුරුදු පහකට වරක් මහ ලේකම්වරයකු පත් කිරීමට ඇති හැකියාවයි.
(2) ගැටුම් පවතින සාමාජික රටවලට හමුදා යැවීමට ඇති බලයයි.
(3) විපත්වලට මුහුණ දුන් සාමාජික රටවලට මානුෂික ආධාර අනුමත කිරීමට ඇති බලයයි.
(4) කිසියම් යෝජනාවක් සම්බන්ධයෙන් නිෂේධ බලය පාවිච්චි කිරීමට ඇති හැකියාවයි.

38. **I** තීරුවේ රහස් ඔත්තු සේවා කිහිපයක් ද, **II** තීරුවේ ඒවා අයිති රටවල් ද දක්වේ. **I** තීරුව අනුව **II** තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| **I** තීරුව | **II** තීරුව |
|---|---|
| (i) K.G.B. ඔත්තු සේවය | *A* – ඇමෙරිකා එක්සත් ජනපදය |
| (ii) මධ්‍යම රහස් ඔත්තු සංවිධානය (CIA) | *B* – ඉන්දියාව |
| (iii) මොසාඩ් සංවිධානය (MOSSAD) | *C* – ඊශ්‍රායලය |
| | *D* – රුසියාව |

(1) *D, A* හා *C* (2) *B, C* හා *D* (3) *C, A* හා *B* (4) *A, D* හා *C*

39. පහත දක්වෙන සංවිධාන බිහි වූ නිවැරදි ඓතිහාසික අනුපිළිවෙළ කුමක් ද ?
*A* – එක්සත් ජාතීන්ගේ සංවිධානය
*B* – සාර්ක් සංවිධානය
*C* – ජාතීන්ගේ සංගමය
*D* – නොබැඳි ජාතීන්ගේ සංවිධානය
(1) *CADB* (2) *ACBD* (3) *DCAB* (4) *CDAB*

40. අනාගත ලෝක මහා සංග්‍රාමයකින් ඇති විය හැකි ප්‍රතිඵලය මින් කුමක් විය හැකි ද ?
(1) යුද කටයුතුවල දී රොබෝ තාක්ෂණය භාවිත කිරීම නිසා මිනිස් ජීවිත විනාශය අවම වනු ඇත.
(2) යුද්ධයේ දී න්‍යෂ්ටික අවි භාවිත කළ හැකි බැවින් ජීව ලෝකයෙන් විශාල ප්‍රමාණයක් වැනසෙනු ඇත.
(3) සංවර්ධිත රටවල් වැඩි ගණනක් විනාශ වී යනු ඇත.
(4) සංවර්ධනය වෙමින් පවතින රටවල් වැඩි ගණනක් විනාශ වී යනු ඇත.


2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | ..3.... | 21 | ..1.... |
| 02 | ..4.... | 22 | ..2.... |
| 03 | ..1.... | 23 | ..4.... |
| 04 | ..2.... | 24 | ..4.... |
| 05 | ..1.... | 25 | ..2.... |
| 06 | ..4.... | 26 | ..2.... |
| 07 | ..1.... | 27 | ..3.... |
| 08 | ..3.... | 28 | ..4.... |
| 09 | ..3.... | 29 | ..3.... |
| 10 | ..1.... | 30 | ..1.... |
| 11 | ..2.... | 31 | ..3.... |
| 12 | ..2.... | 32 | ..4.... |
| 13 | ..3.... | 33 | ..4.... |
| 14 | ..1.... | 34 | ..3.... |
| 15 | ..1.... | 35 | ..3.... |
| 16 | ..4.... | 36 | ..2.... |
| 17 | ..3.... | 37 | ..4.... |
| 18 | ..3.... | 38 | ..1.... |
| 19 | ..4.... | 39 | ..1.... |
| 20 | ..2.... | 40 | ..2.... |


**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 80කි.**

**I පත්‍රය සඳහා අවසන් ලකුණ = $\frac{80}{2}$ = 40**

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව




| විෂය ක්ෂේත්‍ර | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|---|
| ලංකා ඉතිහාසය | 24 | 9 (69%) | 8 (21%) |
| ලෝක ඉතිහාසය | 16 | 25 (74%) | 18 (12%) |




ලංකා ඉතිහාසය සඳහා ප්‍රශ්න 24ක් හා ලෝක ඉතිහාසයට අදාළව ප්‍රශ්න 16ක් I ප්‍රශ්න පත්‍රයට අන්තර්ගතවී ඇත. ලංකා ඉතිහාසයේ සමස්ත පහසුතාව 46%කි. ලෝක ඉතිහාසයට සමස්ත පහසුතාව 49%කි. ලංකා ඉතිහාසයේ සමස්ත පහසුතාව ලෝක ඉතිහාසයට වඩා අඩු වීමට බලපා ඇත්තේ යා කිරීමේ ප්‍රශ්නවලදී කරුණු සියල්ල නිශ්චිතව නොදැනීම, අදාළ වචනාර්ථ අවබෝධ කර ගැනීමේ දුෂ්කරතාව, පුද්ගලයින් හා කාර්යයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබීම සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා වෙන්කර හඳුනා ගැනීමේ විමර්ශනාත්මක දැනුම නොමැති වීම නිසාය. ලෝක ඉතිහාසයේ ප්‍රශ්න 6න් 5ක්ම සකස් වී ඇත්තේ පැරණි ඉන්දියා ඉතිහාසය ඇසුරිනි. ඉන්දියා ඉතිහාසය සිසුන්ට පහසු මාතෘකාවක් වන නිසා නිවැරදි පිළිතුරු නිශ්චිතව දැක්වීම පහසු වී ඇත. අනෙක් ප්‍රශ්න අතුරින් 20, 21, 22 සහ 23 යන ප්‍රශ්න දේශ ගවේශණය, ආගමික ප්‍රතිසංස්කරණ හා කාර්මික විප්ලවය වැනි පහසුවෙන් තොරතුරු ලබාගත හැකි මාතෘකාවලින් සකස්වී තිබේ. මෙම කරුණු නිසා ලෝක ඉතිහාසය වැඩි පහසුතා දක්වා ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිදුවීම්, පුද්ගලයන්, වර්ෂ හා ඒවා සම්බන්ධ අවස්ථා පිළිබඳව නිවැරදි කරුණු දැක්වීම හා අභ්‍යාස කරවීම සුදුසු ය. විෂය කරුණුවලට අදාළ සංකල්ප පිළිබඳ අර්ථ නිරූපණය, ප්‍රශ්නවලින් අසා ඇති දේ නිවැරදිව තේරුම් ගැනීමේ හැකියාව ආදිය වර්ධනය කළ යුතුය.

2.1.5 **I** ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 |
| 1 | 3 | 14% | 12% | 63% | 11% |
| 2 | 4 | 19% | 11% | 22% | 48% |
| 3 | 1 | 47% | 12% | 21% | 20% |
| 4 | 2 | 22% | 48% | 18% | 12% |
| 5 | 1 | 44% | 11% | 37% | 8% |
| 6 | 4 | 10% | 24% | 8% | 58% |
| 7 | 1 | 29% | 42% | 13% | 16% |
| 8 | 3 | 20% | 7% | 21% | 52% |
| 9 | 3 | 5% | 16% | 69% | 10% |
| 10 | 1 | 36% | 17% | 37% | 10% |
| 11 | 2 | 20% | 52% | 18% | 10% |
| 12 | 2 | 13% | 47% | 14% | 26% |
| 13 | 3 | 11% | 16% | 62% | 11% |
| 14 | 1 | 40% | 23% | 17% | 20% |
| 15 | 1 | 57% | 9% | 28% | 6% |
| 16 | 4 | 18% | 31% | 18% | 33% |
| 17 | 3 | 13% | 21% | 57% | 9% |
| 18 | 3 | 40% | 25% | 12% | 23% |
| 19 | 4 | 10% | 36% | 11% | 43% |
| 20 | 2 | 14% | 57% | 16% | 13% |
| 21 | 1 | 44% | 21% | 23% | 12% |
| 22 | 2 | 15% | 45% | 18% | 22% |
| 23 | 4 | 22% | 10% | 9% | 59% |
| 24 | 4 | 8% | 10% | 23% | 59% |
| 25 | 2 | 8% | 74% | 10% | 8% |
| 26 | 2 | 27% | 27% | 16% | 30% |
| 27 | 3 | 12% | 13% | 43% | 32% |
| 28 | 4 | 19% | 6% | 25% | 50% |
| 29 | 3 | 11% | 21% | 59% | 9% |
| 30 | 1 | 26% | 26% | 18% | 30% |
| 31 | 3 | 10% | 23% | 50% | 17% |
| 32 | 4 | 21% | 8% | 12% | 59% |
| 33 | 4 | 10% | 8% | 31% | 51% |
| 34 | 3 | 21% | 23% | 42% | 14% |
| 35 | 3 | 32% | 12% | 48% | 8% |
| 36 | 2 | 14% | 51% | 18% | 17% |
| 37 | 4 | 20% | 15% | 25% | 40% |
| 38 | 1 | 53% | 13% | 16% | 18% |
| 39 | 1 | 46% | 17% | 17% | 20% |
| 40 | 2 | 15% | 66% | 9% | 10% |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

2012 ඉතිහාසය I ප්‍රශ්න පත්‍රය සකස් කිරීමේදී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 24ක් ද, ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 16ක් ද ඇතුළත් වී ඇත. ලංකා ඉතිහාසය යටතේ අසා ඇති 1, 9 හා 13 යන ප්‍රශ්නවල පමණක් පහසුතා 60% ඉක්මවා ඇති අතර, ඒ යටතේ අසා ඇති 8, 26 හා 30 ප්‍රශ්නවල පහසුතා 30%ටත් අඩු අගයකි.

ලංකා ඉතිහාසයට අදාළව 1, 2, 3, 4 සහ 16 වැනි ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සැපයීමේ පහසුතා 33% සිට 63% දක්වා වේ. එම ප්‍රශ්න ඉතිහාසය ඉගෙන ගැනීමේ මූලාශ්‍රය ඇසුරින් සකස් කර ඇති නමුත් මූලාශ්‍ර පිළිබඳ සිසුනට නිවැරදි අවබෝධයක් නොමැති බව පෙනී යයි. ඉතිහාසය පිළිබඳ නිර්වචන ප්‍රදර්ශනය කිරීම තුළින් මතක ශක්තිය වර්ධනය කළ හැකිය. මූලාශ්‍රය හා ඒවායේ අන්තර්ගත ප්‍රධාන කරුණු වගුගත කිරීම ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී යොදා ගැනීම සුදුසුය.

9 හා 13 ප්‍රශ්නවලින් ලංකා ඉතිහාසයේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ දේශපාලන හා ආර්ථික ලක්ෂණ පිළිබඳ හැකියාව පිරික්සා ඇත. මෙයට දක්වා ඇති නිවැරදි ප්‍රතිචාර පිළිවෙළින් 69%ක් හා 62%කි. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලනයට හා ආර්ථිකයට අදාළ කරුණු ආකර්ශනීය වීම නිසා සතුටුදායක සාධන මට්ටමකට ළඟා වී ඇත. 6, 7 ශ්‍රේණිවලදී මේ පිළිබඳ සාකච්ඡා වීම, පෙළ පොත් හා බාහිර පොත් පරිශීලනයට අවස්ථාව තිබීම සාර්ථකත්වයට බලපා ඇත. තව දුරටත් සංවර්ධනය සඳහා කෙටි ප්‍රශ්න සකස් කිරීම, කරුණු ගොනු කොට බිත්ති පුවත්පත් මඟින් ප්‍රදර්ශනය කරවීම සුදුසුය. පන්ති කාමරය තුළ දැනුම මිනුම තරඟ පැවැත්වීම හා දෙන ලද මාතෘකානුකූලව ක්ෂණික කථා ඉදිරිපත් කිරීම වැනි අවස්ථා ලබා දිය හැකිය.

8 වැනි ප්‍රශ්නය සඳහා නිවැරදි ප්‍රතිචාර දක්වා ඇත්තේ 21%කි. 4 වැනි වරණය නිවැරදි යැයි සිතා 52%ක් ප්‍රතිචාර දක්වා ඇත. සීගිරියේ කලා නිර්මාණ පිළිබඳව සිසුන් වැඩි අවධානය යොමුකර තිබීම එයට හේතුවයි. එහෙත් සීගිරිය පිළිබඳ අධ්‍යයනයේදී තාක්ෂණය හා පරිසර සංරක්ෂණය පිළිබඳ වැඩි වැදගත්කමක් ඇති බව අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම අවශ්‍ය වේ.

14 වැනි ප්‍රශ්නය සකස් වී ඇත්තේ ලංකා ඉතිහාසයේ කාල වකවානු පිළිබඳ අවබෝධය විමසා බැලීම සඳහාය. එයට දක්වා ඇති නිවැරදි ප්‍රතිචාර සංඛ්‍යාව 40%කි. 60%ක්ම තෝරා ඇත්තේ වැරදි වරණයන් ය. කාල වකවානු හා සිදුවීම් පිළිබඳව නිවැරදි අවබෝධයක් නොවීම ඊට හේතුවයි. රාජ්‍ය නාමාවලියේ වැදගත් රජවරුන්ගේ අනුපිළිවෙළ හා සිදුවීම් අතර සම්බන්ධතාව ගොඩනැංවීමට, සිද්ධි ගැළපීම, වගු ගත කිරීම වැනි අභ්‍යාස සඳහා මඟ පෙන්වීම යෝග්‍ය වේ.

26 හා 30 ප්‍රශ්නවලට නිවැරදි ප්‍රතිචාර දැක්වීම ද අඩු මට්ටමක පවතී. 26 වැනි ප්‍රශ්නයට වරණ 4 සඳහා ප්‍රතිචාර දැක්වීම 27%, 27%, 16% හා 30% වශයෙන් ද, 30 වැනි ප්‍රශ්නයට එය 26%, 26%, 18% හා 30% වශයෙන් ද වේ. මෙම ප්‍රශ්න දෙක ගොඩනැගී ඇත්තේ පිළිවෙළින් මහනුවර රාජධානිය සහ ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සම්බන්ධව ය. එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති වරණ බොහෝ දුරට සමාන බැවින් නිවැරදි වරණය තෝරා ගැනීම සැක සහිත වී ඇත. මේ නිසා නිවැරදි ප්‍රතිචාර අඩුය. වරණවල වෙනස්කම් තේරුම් ගෙන වඩා නිවැරදි පිළිතුර තෝරා ගැනීමට මඟ පෙන්වීම අවශ්‍ය වේ. දී ඇති කරුණුවල වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුරු ලකුණු කරවීම ප්‍රතිඵල දායක ය.

ලෝක ඉතිහාසය යටතේ අසා ඇති 25 හා 40 ප්‍රශ්නවලට පමණක් 60%කට වැඩි පහසුතා දක්වා ඇති අතර ඒ යටතේ අසා ඇති 7 හා 18 ප්‍රශ්න දෙකට පමණක් 30%කටත් අඩු පහසුතා දක්වා ඇත.

ලෝක ඉතිහාසය කොටසට අදාළ වූ 25 වැනි ප්‍රශ්නයේ නිවැරදි වරණයට 74%ක් ප්‍රතිචාර දක්වා ඇත. මහා අක්බාර් රජතුමාගේ ප්‍රතිපත්ති පිළිබඳව ඇති පැහැදීම ද ඔහුගේ ප්‍රකාශ පෙළ පොතේ සිත් ගන්නා ආකාරයට සඳහන් කර තිබීමද කරුණු මතකයේ තබා ගැනීමට උපකාරී වී ඇත. රජවරුන්ගේ විශේෂ සිදුවීම් ආශ්‍රිත තොරතුරු රසවත්ව ඉදිරිපත් කිරීම තුළ සාධන මට්ටම තවදුරටත් ඉහළ නංවා ගත හැකිය. මේ සඳහා පද්‍ය, වගන්ති, ප්‍රකාශ යොදාගත හැකි ය.

ලෝක මහා සංග්‍රාම ආශ්‍රිතව සකස් වී ඇති 40 වැනි ප්‍රශ්නය සඳහා 66% දෙනෙක් නිවැරදි වරණය තෝරා ඇත. නවීන තාක්‍ෂණය හා යුධ අවි පිළිබඳ බාහිර පරිසරයෙන් ලද දැනුම මේ සඳහා උපයෝගී වූවා විය හැකිය. විෂය කරුණුවලට අදාළ තොරතුරු විවිධ මාධ්‍යයන් මඟින් ලබා ගැනීම, ඒවා ප්‍රදර්ශනය කිරීම, තොරතුරු සාරාංශ ගත කිරීම දැනුම සංවර්ධනය සඳහා යොදාගත හැකිය.

7 වැනි ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත්තේ ඉන්දියාවට එල්ලවූ මුස්ලිම් ආක්‍රමණ පිළිබඳව ය. නිවැරදි වරණය තෝරා ඇත්තේ 29%කි. 42%ක්ම නිවැරදි නොවන දෙවන වරණය තෝරා ඇත. කාල වකවානු සමඟ ආක්‍රමණයන්හි අරමුණුවල ස්වභාවය වෙනස් වූ ආකාරය පිළිබඳ අවබෝධයක් නොමැත. ඉන්දියාවට එල්ල වූ මුස්ලිම් ආක්‍රමණවල කාලීන වෙනස්කම් හා ඒවායේ අරමුණු පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කිරීම වැදගත් ය. මේ සඳහා වර්ෂ හා මුස්ලිම් ආක්‍රමණවල අරමුණු පෙළගැස්වීම, වගුගත කිරීම සිදුකළ හැකිය.

18 වන ප්‍රශ්නය ඉන්දියාවේ මුස්ලිම් බලය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳව සකස් වී ඇත. ඊට නිවැරදි පිළිතුරු දක්වා ඇත්තේ 12%වැනි අඩු ප්‍රමාණයකි. විෂය කරුණුවල එක හා සමාන නම් භාවිත වන බැවින් කරුණු වෙන් කර ග්‍රහණය කර ගැනීම දුෂ්කරය. මතක තබා ගැනීමේ අපහසුතාව නිසාම වැරදි ප්‍රතිචාර ඉහළ මට්ටමක් ගනී. පුද්ගලයින්ට අදාළ කරුණු වෙන වෙනම ගොනු කිරීම, වගු ගත කිරීම, කරුණු තහවුරු කර ගැනීමට රුකුලක් වනු ඇත.

ඉහළ සාධන මට්ටමක් අයදුම්කරුවන්ට ලබා දීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිතියම්, පින්තූර හා වගු සටහන් භාවිත කිරීම, දැනුම මිනුම තරඟ පැවැත්වීම මඟින් ප්‍රිය මනාප ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම සුදුසු ය.

කරුණු මතක තබා ගැනීමේ දුර්වලතා, සුවිශේෂී කරුණු පිළිබඳ අවධානය යොමු නොකිරීම, ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ නිපුණතාව ප්‍රමාණවත් නොවීම සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇති අතර ප්‍රශ්න නිවැරදිව තේරුම් ගැනීමට සැලැස්වීම, සංකල්ප හා වචනාර්ථ පිළිබඳ දැනුම සිසුන් සමඟ සාකච්ඡා කිරීම මගින් එවැනි දුර්වලතා මඟහරවා ගැනීමට සිසුන් යොමු කිරීමෙන් ඉහළ සාධන මට්ටමක් ළඟා කර ගත හැකිය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 03යි. මුළු ලකුණු 120යි.**

II ප්‍රශ්න පත්‍රය I, II හා III ලෙස ප්‍රධාන කොටස් 3කින් යුක්තය.

I කොටස

පළමුවන ප්‍රශ්නය පමණක් මෙම කොටසට අයත් වන අතර, එය (අ) සහ (ආ) ලෙස කොටස් දෙකකින් යුක්ත අනිවාර්ය ප්‍රශ්නයකි. (අ) කොටසට ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන 10ක් ලකුණු කර නම් කිරීම ද ලෝක ආකෘති සිතියම් කොටසක ඓතිහාසික ස්ථාන 8ක් ලකුණු කර නම් කිරීම ද අපේක්ෂිතය. ඒ සඳහා ලකුණු 10 සහ 8ක් ලෙස ලකුණු 18ක් වෙන් කෙරේ. (ආ) කොටසට පින්තූර ආශ්‍රිත හා ඓතිහාසික සිදුවීම්වලට අදාළව කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ලකුණු 12ක් ද වෙන් කෙරේ.

II කොටස

මෙම කොටස ලංකා ඉතිහාසයට අදාළව ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 5කින් යුක්ත වන අතර ඉන් 3කට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් මුළු ලකුණු 54ක් වෙන් කෙරේ.

III කොටස

මෙම කොටස ඉන්දීය, යුරෝපා හා ඈත පෙරදිග ආසියාතු රටවල ඉතිහාසයට අදාළව ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 4කින් යුක්ත අතර ඉන් 2කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් මුළු ලකුණු 36ක් වෙන් කෙරේ.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 30 + 54 + 36 = 120

II පත්‍රයට අවසාන ලකුණ = $\frac{120}{2}$ = 60

2.2.2. **II** ප්‍රශ්න පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| ⋆ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4.1, 4.2 හා 4.3 ඇසුරින් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත. |

1 ප්‍රශ්නය

# I කොටස

**1.** (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කන්තලේ වැව, ජජ්ජර නදිය, පේරාදෙණිය, තන්ත්‍රිමලේ, ගෝකණ්ණ විහාරය, නල්ලූර්, මීගමුව, කළුතර, බදුල්ල, මුල්ලේරියාව *(ලකුණු10 යි)*

(ii) සින්ධු ගඟ, බතාවිය, කල්කටා, ජෙරුසලම, සිංගප්පූරුව, තායිලන්තය, හිරෝෂිමා, සස්නි *(ලකුණු 08 යි)*

(ආ) (i) පහත *A, B, C, D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්ද'යි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* – මහාවංශයේ සඳහන් වන අන්දමට ශ්‍රී ලංකාවට ගොඩබට පළමු ආර්ය සංක්‍රමණික කණ්ඩායමේ නායකත්වය දැරීම

*B* – ඉතාලියට දේශපාලන නායකත්වය දෙමින්, එම රට දෙවන ලෝක මහා සංග්‍රාමයට යොමු කිරීම

*C* – දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ පඬාවැව විශාල කරවා එම ප්‍රදේශය සංවර්ධනය කිරීම

*D* – ඉන්දියාවේ මුස්ලිම් බහුතරයක් වාසය කරන ප්‍රදේශ සඳහා වෙනම රාජ්‍යයක් ලබා ගැනීමට කටයුතු කිරීම *(ලකුණු 04 යි)*

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii)
1. *A* නිර්මාණයෙන් දක්වෙනුයේ කුමක් ද ?
2. මෙය දක්නට ලැබෙන ඓතිහාසික නගරය කුමක් ද ?
3. මෙම නිර්මාණය සඳහා ආකෘතිය ලෙස යොදගෙන ඇති පුෂ්පය කුමක් ද ?
4. මෙය කවර රජකෙනකු විසින් කරවන ලද්දක් දයි සැලකේ ද ? *(ලකුණු 04 යි)*



*A*

(iii)
1. *B* පින්තූරයෙන් දක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද ?
2. මෙතුමා කටයුතු කරන ලද්දේ කවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවැති රජයක ද ?
3. මෙතුමා විසින් සියලු ම ශ්‍රී ලාංකික දරුවන්ට ලබාදුන් වරප්‍රසාදය කුමක් ද ?
4. කුසලතා පූර්ණ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා මෙතුමා විසින් ආරම්භ කරන ලද පාසල් කවර නමකින් හැඳින්වූයේ ද ? *(ලකුණු 04 යි)*




*B*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


1 ප්‍රශ්නය

(1) (අ) (i)




(ලකුණු 10)

(1) (අ) (ii)





(ලකුණු 08)

(ආ) (i) *A* - විජය කුමරු
*B* - බෙනිටෝ මුසෝලිනි/ මුසොලිනි
*C* - පළමුවන පරාක්‍රමබාහු රජ/ මහා පරාක්‍රමබාහු රජ
*D* - මොහොමඩ් අලි ජින්නා/ අලි ජින්නා (ලකුණු 04)


(ii) 1. පොකුණකි
2. පුලතිසිපුර/ පොළොන්නරුව
3. නෙළුම් මල
4. පළමුවන පරාක්‍රමබාහු රජ/ මහා පරාක්‍රමබාහු රජ (ලකුණු 04)

(iii) 1. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර
2. ඩොනමෝර්/ 1931 ප්‍රතිසංස්කරණ
3. නිදහස් අධ්‍යාපනය
4. මධ්‍ය විද්‍යාල (ලකුණු 04)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




1 ප්‍රශ්නය අනිවාර්ය වුවත් පිළිතුරු සපයා ඇත්තේ 99%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 46%ක් ද,
ලකුණු 16 - 22 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 23 - 30 ප්‍රාන්තරයේ 3%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 23 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 3%ක් වන අතර 39%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අනුකොටස් 14ක් ඇති අතර ඉන් අනුකොටස් 5ක පහසුතාව 70%කට වැඩිය. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (ii) 3 වන අතර එහි පහසුතාව 94%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (අ) (ii) ය. එහි පහසුතාව 15%කි.

පළමු ප්‍රශ්නයේ (ආ) කොටසේ (i) *A*, (ii) 1, 3, (iii) 1, 3 යන අනුකොටස් සඳහා පහසුතා 70%ට වැඩිය. මෙහිදී පහළ ශ්‍රේණිවල සිට ලබාගත් දැනුම හා නිතර ඇස ගැටෙන පින්තූර මගින් ග්‍රහණය කරගත් තොරතුරු ඇසුරින් සාධනය වැඩි කර ගෙන ඇත. මේ අනුව විෂය නිර්දේශයට අදාළ පෙළපොතේ දැක්වෙන පින්තූර සිසුන්ට නිතර දර්ශනය වීමට සැලැස්වීම හා එම පින්තූර අනුසාරයෙන් කෙටි ප්‍රශ්න හා පිළිතුරු සකස් කිරීමට ඔවුන් යොමු කරවීම මගින් සාධනය තවත් වැඩි කළ හැකි වේ.

(ආ) (i) *C*, (ආ) (ii) 4, (ආ) (iii) 2, 4 යන අනුකොටස්වල පහසුතා 30%කටත් වඩා අඩු අගයකි. පළමු ප්‍රශ්නයේ සමහර අනුකොටස්වල පහසුතා අඩුවීමට සිතියම් ලකුණු කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම, ඓතිහාසික ස්ථාන පිහිටීම පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොමැති වීම, රජවරුන්ගේ කාර්ය සංසිද්ධීන් පිළිබඳ දැනුවත් නොවීම, කන්නන්ගර මැතිතුමාගේ යුගය, එම කාලයේ පැවති රාජ්‍ය පාලනය, එතුමාගේ මධ්‍ය විද්‍යාල සංකල්පය එකිනෙක අතර පැවති සම්බන්ධය සිසුන් තුළ අවබෝධ වී නොමැතිවීම යන කරුණු හේතු වී ඇත. පාසලේදී සිතියම් ලකුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වන අතර, සිතියමක ඓතිහාසික ස්ථාන ලකුණු කිරීමේ දී ඒවාට අදාළ භෞතික ලක්ෂණ උපයෝගි කර ගනිමින් නිශ්චිතව ස්ථාන, හඳුනා ගැනීමට නිපුණතාව ලබා දිය හැකිය. නිශ්චිතව ස්ථාන, නිවැරදිව ලකුණු කරන ලද සිතියමක් සිසුන්ට ලබාදී එම ස්ථාන නම් කිරීමට හැකිවන සේ අභ්‍යාසවල යෙදවීම ද සුදුසු ය. ඓතිහාසික ස්ථාන හඳුනාගැනීමේදී භෞතික ලක්ෂණ මෙන්ම ඒ හා බැඳුන ඓතිහාසික තොරතුරු අධ්‍යයනයට යොමු කිරීම ද වැදගත් වේ.

සිතියම් ලකුණු කොට, නම් කරවීම පිළිබඳ අභ්‍යාස කරවීම ද යෝග්‍ය වේ. නිවැරදිව ලකුණු කොට නම් කර ඇති සිතියම් දෘශ්‍යාධාර වශයෙන් භාවිත කළ හැකිය. සිතියම් ලකුණු කිරීමේ දී එක් එක් මාතෘකාවලට අදාළව ලකුණු කරවීම, සිතියම් ලකුණු කිරීමේ කඳවුරු පැවැත්වීම සහ ඓතිහාසික සිතියම් සංග්‍රහ සකස් කරවිය හැකිය. රජවරුන්ගේ කාර්ය සංසිද්ධි වෙන් වෙන්ව වගුගත කරවීම, රජවරුන් පිළිබඳ කුඩා කතන්දර කියවීමට යොමු කිරීම, රජවරුන්ගේ නම් ලිවීමේ දී පළමුවන, දෙවන, තෙවන ආදී වශයෙන් හඳුන්වාදීම එක් එක් යුගවල රාජ්‍ය පාලනය හා එම වකවානුවට සුවිශේෂි චරිත හා ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව අවබෝධය හා සම්බන්ධය ගොඩනැගීම තුළින් ඉතිහාසය විෂයයේ මතකය වර්ධනය කර ගැනීමට සිසුන් පෙළඹවිය හැකිය.

# II කොටස

## 2 ප්‍රශ්නය

නිපුණතාව : ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ දේශපාලන හා ආර්ථික තත්ත්වය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

**2.** (i) යාබද ලංකා සිතියමෙහි $A, B, C$ යනුවෙන් ලකුණු කොට ඇත්තේ ඉන්දියානු සංක්‍රමණිකයන් මෙරට ජනාවාස පිහිටුවීම සඳහා තෝරාගත් ගංගා නිම්න තුනකි. ඒවා අනුපිළිවෙළින් නම් කරන්න.

*(ලකුණු 03 යි)*

(ii) පහත $D, E, F$ හා $G$ වලින් දක්වෙන එක් එක් ඓතිහාසික සිද්ධිය හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් වරහන් තුළ දී ඇති ඒවායින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

*D* – ප්‍රථම වරට අනුරාධපුරය සිය අගනුවර කරගැනීම

*E* – ප්‍රථම වරට ක්ෂත්‍රිය අභිෂේක උත්සවයක් මෙරට දී පැවැත්වීම

*F* – රුවන්මැලිසෑය, මිරිසවැටිය වැනි ස්තූප කරවීම


*G* – මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට අනුග්‍රහය දැක්වීම

(දුටුගැමුණු, කාවන්තිස්ස, පණ්ඩුකාභය, පණ්ඩුවාසදේව, දේවානම්පියතිස්ස, වළගම්බා, වෝහාරිකතිස්ස)

*(ලකුණු 04 යි)*

(iii) වසභ රාජ්‍ය සමයේ දේශපාලන හා ආර්ථික වැදගත්කම නිදසුනක් බැගින් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iv) ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ මෙරට විවිධ කර්මාන්ත දියුණුව පැවැති බව නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*




අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(2) (i) *A* - කදම්බ නදී/ මල්වතු ඔය/ අරවි ආරු

*B* - ගෝණ නදී/ කලා ඔය

*C* - ගාල්හ නදී/ ගල් ඔය **(ලකුණු 1 × 3 = 03)**

(ii) *D* - පණ්ඩුකාභය

*E* - දේවානම් පියතිස්ස

*F* - දුටු ගැමුණු

*G* - වළගම්බා **(ලකුණු 1 × 4 = 04)**

(iii) දේශපාලන වැදගත්කම :

- නව රාජවංශයක් යටතේ බලයට පත්වීම (ලම්බකරණ රාජවංශය)
- දිවයින පුරාම බලය ව්‍යාප්තව තිබීම (උතුර, දකුණ, බටහිර හා නැගෙනහිරින් හමුවූ සෙල්ලිපිවලින් මෙය තහවුරු වේ.)
- ශක්තිමත් ප්‍රාදේශීය පාලනයක් පැවතීම
- දිගු කාලීන සාමකාමී පාලනයක් පැවතීම

ආර්ථික වැදගත්කම :

- විශාල වැව් ඉදි කිරීම ආරම්භ වීම (මහාවිලච්චිය, මනාකැටිය වැව ...... යනාදී වැව්)
- ඇළහැර ඇළ නිර්මාණය කිරීම


**(ලකුණු 2 + 3 = 05)**

(iv) - ලෝහ කර්මාන්තය/ පේෂ කර්මාන්තය/ කුඹල් කර්මාන්තය/ පතල් කර්මාන්තය/ කෘෂි පාදක කර්මාන්තය/ වඩු කර්මාන්තය


(සාහිත්‍ය මූලාශ්‍රවලින් මෙන්ම පුරා විද්‍යාත්මක සාධකවලින්ද මේ බව තහවුරු වේ.

**(ලකුණු 3 + 3 = 06)**

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




2 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 83%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 38%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 37%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 16%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 9%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 9%ක් වන අතර 38%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (ii) හි $F$ වන අතර එහි පහසුතාව 83%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iv) ය. එහි පහසුතාව 27%කි.

ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම හා රජවරුන්ගේ දේශපාලනික, ආර්ථික හා ආගමික සේවාවන් පිළිබඳව සකස් වී ඇති මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති සංඛ්‍යාව 83%කි. වැඩි පහසුතා පෙන්වා ඇත්තේ (ii) කොටසේ $F$ හා $G$ ය. එය පිළිවෙළින් 83%ක් හා 75%ක් වේ. මෙහිදී වරහන් තුළ පිළිතුරු සඳහන් කර තිබූ බැවින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම පහසු වී ඇත. (iii) හා (iv) කොටස්වලට අඩුම පහසුතා දක්වයි. එය පිළිවෙළින් 31%ක් හා 27% වේ. රජවරුන්ගේ කාර්යයන් පිළිබඳ නොදැනුවත්කම හා දේශපාලන, ආර්ථික, ආගමික වශයෙන් වෙන් කර හඳුනා ගැනීමේ අවබෝධයක් නොමැති වීමත් මීට හේතු වී ඇත. එමෙන්ම කර්මාන්ත පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේ දී කෘෂි කර්මාන්තය ද කර්මාන්තයක් ලෙස වරදවා තේරුම් ගෙන තිබිණි. පිළිතුරු සැපයීමේ දී කරුණු විස්තර කිරීම හා පැහැදිලි කිරීම පිළිබඳ පැවති හැකියාව ප්‍රමාණවත් නොවන බව ප්‍රදර්ශනය කර ඇත.

මෙම විෂය කොටස් පහසු කර ගැනීම සඳහා ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ රජවරුන්ගේ දේශපාලන, ආර්ථික හා ආගමික තොරතුරු පිළිබඳව කරුණු සෙවීමට යොමු කරවීම, ඒවායේ කාල වකවානු පිළිබඳ අවබෝධය ලබාදීම හා එම කරුණු වගුගත කරවීම සිදුකළ හැකි ය. බුද්ධි මණ්ඩල සාකච්ඡා පැවැත්වීම ද, සමාරෝපනය වැනි ක්‍රියාකාරකම් කිරීම ද කරුණු විස්තර කිරීමට හා පැහැදිලි කිරීමට අභ්‍යාස කරවීම සුදුසු ය.

3 ප්‍රශ්නය

නිපුණතාව : ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්තවල වර්ධනය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

**3.** (i) පහත සඳහන් වැව් කවර ගංගා හරස් කොට නිර්මාණය කර ඇත්දැයි, දී ඇති ගංගා ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

*A* – නාච්චදූව වැව

*B* – විලච්චිය වැව

*C* – හුරුලු වැව

(ගල් ඔය, මල්වතු ඔය, යාන් ඔය, මෝදරගම් ආරු, කනගරායන් ආරු, මී ඔය) *(ලකුණු 03 යි)*

(ii) පහත සඳහන් තොරතුරුවලට සම්බන්ධ වාරි නිර්මාණ අනුපිළිවෙළින් නම් කරන්න.

*A* – නාගරික අවශ්‍යතාවලට මුල්තැන දෙමින් දේවානම්පියතිස්ස රජතුමා විසින් අනුරාධපුරයේ කරවන ලද වැව

*B* – මහවැලි ගඟෙහි නැම්මක් උපයෝගී කර ගනිමින් මහියංගණයට දකුණින් තනා ඇති අමුණ

*C* – දැදුරු ඔය හරස් කර මාගල්ල වැවට ජලය ගෙන යාම සඳහා තනා ඇති ඇළ

*D* – පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යාම සඳහා අඹන් ගඟ හරස් කොට තැනූ අමුණ *(ලකුණු 04 යි)*

(iii) පැරණි වාරි ශිල්පීන් ඇළ මාර්ග නිර්මාණය කිරීමේ දී තාක්ෂණය යොදගත් ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) වැව් ආරක්ෂා කර ගැනීමටත්, ඒවායේ පැවැත්මටත් පැරණි වාරි ශිල්පීන් උපයෝගී කරගත් ක්‍රියා මාර්ග **තුනක්** පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (i) *A* - මල්වතු ඔය

*B* - මෝදරගම් ආරු

*C* - යාන් ඔය

**(ලකුණු 1 × 3 = 03)**

(ii) - තිසා වැව
- මිනිපේ අමුණ
- රිදී බැඳි ඇළ
- අංගමැඩිල්ල අමුණ

**(ලකුණු 1 × 4 = 04)**

(iii) - ජලයේ වේගය පාලනය කිරීම සඳහා ගල් පුවරු සවි කිරීම (නිදසුන් : ඇළහැර ඇළ මාර්ගය)
- අතිරික්ත ජලය පිට කිරීම සඳහා කළුගල් වාන් සකස් කිරීම
- උමං ජල තාක්ෂණය
  නිදසුන් : තිසා වැවේ ජලය රන්මසු උයනට යැවීම
- සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙන යාම
  නිදසුන් : යෝධ ඇළ
- අන්තර් ගංගා ද්‍රෝණි ඇළ මාර්ග නිර්මාණය
- වැව් කිහිපයක් සම්බන්ධ කරමින් ඇළ මාර්ග නිර්මාණය කිරීම


**(ලකුණු 2 + 3 = 05)**

(iv) - වැව් බැමි නිර්මාණය
- සළපනාව නිර්මාණය
- බිසෝකොටුව නිර්මාණය
- පිටවාන/ ඇතුළුවාන නිර්මාණය
- සොරොව්ව නිර්මාණය
- ඉස්වැටි. කළිඟුබැමි, තාවුල්ල හා කුළුවැව් නිර්මාණය


(කාර්යයන් දැක්වීම අවශ්‍ය වේ)

**(ලකුණු 3 + 3 = 06)**

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




3 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 62%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 38%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 39%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 16%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 7%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 7%ක් වන අතර 38%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) වන අතර එහි පහසුතාව 57% කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (ii) $D$ ය. එහි පහසුතාව 8%කි.

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරිකර්මාන්තවල වර්ධනය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇත. තුන්වන ප්‍රශ්නයට පිළිතුරු ලියා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 62%ක් පමණි. මෙහි වැඩි පහසුතා පෙන්වා ඇත්තේ (ii) හි $A$ අනුකොටසට හා (iv) වෙනි කොටසට ය. එය පිළිවෙළින් 52%ක් හා 57%කි. දේවානම්පියතිස්ස රජු පිළිබඳ වෙනත් විෂයයන්ගෙන් හා විවිධ මාධ්‍යයන් මගින් තොරතුරු නිරන්තරයෙන් ලැබීම ඊට හේතු වී ඇත.

(ii) $C$ සහ $D$ අනුකොටස්වල පහසුතා අඩුම වන අතර පිළිවෙළින් එය 15%ක් හා 8%කි. පෙළ පොතේ තිබෙන සුවිශේෂී කරුණු පිළිබඳව ගංගා ඒ හා සම්බන්ධ වන අමුණු, ඇළ මාර්ග හා වැව් පිළිබඳව සැළකිල්ලක් නොදැක්වීම වැනි කරුණු නිසා සාධනය අඩු වී ඇත.

වැව් පිළිබඳ ජනප්‍රවාද ඇසුරින් ගොඩනැගුන කතාන්දරවලට සිසුන් ප්‍රිය කරන ලෙස ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදවීම හා වැවක ආකෘතිය නිර්මාණය කරවීම මගින් සිසුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවිය හැකිය. ගංගා හා සම්බන්ධ ප්‍රධාන අමුණු හා ඇළ මාර්ග වගුගත කිරීම, ගංගා ඇළ මාර්ග හා අමුණු යා කිරීමේ අභ්‍යාස කරවීම, සිතියම් ලකුණු කරවීමේ දී වාරි කර්මාන්තවල සම්බන්ධතාව ඉස්මතු වන සේ කරුණු පෙන්වා දීම වැනි ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීම තුළින් විෂය සාධනය ඉහළ නැංවිය හැකිය.

## 4 ප්‍රශ්නය

නිපුණතාව : ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ ශ්‍රී ලංකාව හා විදේශයන් අතර පැවති සම්බන්ධතාවල ස්වභාවය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

**4.** (i) යාබද සිතියමෙහි ශ්‍රී ලංකාවේ ඓතිහාසික නැව් තොටු තුනක් *A, B, C* යටතේ දක්වා ඇත. ඒවා අනුපිළිවෙළින් නම් කරන්න.

*(ලකුණු 03 යි)*

(ii) *A* – අනුරාධපුර හා පොළොන්නරු යුගවල දී ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ ගනුදෙනු කළ රටවල් **දෙකක්** ද

*B* – මෙරටට ආනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය **දෙකක්** ද සඳහන් කරන්න.

*(ලකුණු 04 යි)*

(iii) ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ දී ශ්‍රී ලංකාව වැදගත් ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයක් වූයේ ඇයිදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

*(ලකුණු 05 යි)*


(iv) අතීත විදේශ සම්බන්ධතා නිසා මෙරට

*A* – ආගමික

*B* – කලා ශිල්ප

යන අංශවල ඇති වූ වර්ධනය **නිදසුන් දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 06 යි)*




**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(4) (i) *A* - ගෝකණ්ණ/ ත්‍රිකුණාමලය

*B* - මහාතිත්ථ/ මාතොට/ මාන්තෙයි/ මාන්තොට්ටම්/ මන්නාරම

*C* - ගොඩවාය (ලකුණු 1 × 3 = 03)

(ii) *A* - ඉන්දියාව, චීනය, බුරුමය, අරාබිය, පර්සියාව, ග්‍රීසිය, රෝමය


*B* - අශ්වයන්, සුවඳ විලවුන්, සේද රෙදි, පිගන් භාණ්ඩ, පබලු, රන්, රිදී, බුමුතුරුණු, ඖෂධ, ජේඩ්, කපුරු, වීදුරු, වයින්, කස්තුරි, සඳුන් (ලකුණු 2 × 2 = 04)

(iii)
- ★ පෙර අපරදෙදිග වෙළඳ මාර්ගයේ පිහිටීම
- ★ අගනා වෙළඳ භාණ්ඩ තිබීම (අලි ඇතුන්, මැණික්, මුතු ආදී ...)
- ★ වෙළඳ වරායන් පිහිටීම (මහාතිත්ථ, ගෝකණ්ණ, ගෙඩවාය, දේවනගර ...)
- ★ නිරිත - ඊසාන මෝසම් සුළං කලාපයේ පිහිටීම (ලකුණු 2 + 3 = 05)


(iv) *A* - ආගමික
- ★ බෞද්ධ හා හින්දු ආගම් ලැබීම
- ★ භික්ෂු, භික්ෂුණි, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස ඇති වීම
- ★ මහායාන, වෛතුල්‍යවාදය හා සම්බන්ධ අදහස් ප්‍රචලිත වීම
- ★ පොළොන්නරු යුගයේ දී හින්දු ආගමේ ව්‍යාප්තිය/ ඇදහිලි හා තොවිල්
- ★ හින්දු ආගමික අදහස් හා බෞද්ධ ආගමික අදහස් සංකලනය වීම
- ★ දේවාල ඇතිවීම

*B* - කලා ශිල්ප
- ★ විවිධ කලා ශිල්ප කෙරෙහි ඉන්දියානු ආභාසය ලැබීම (මෞර්ය, ගුප්ත, පල්ලව, චෝල හා විජයනගර් ආභාසය)
- ★ ගෘහ නිර්මාණය
- ★ කැටයම්
- ★ මූර්ති
- ★ චිත්‍ර ශිල්පය
- ★ භාෂා හා සාහිත්‍යය (ලකුණු 3 + 3 = 06)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 71%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14%ක් වන අතර 30%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් හා අනුකොටස් 8ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (i) *A* වන අතර එහි පහසුතාව 85%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (i) *C* ය. එහි පහසුතාව 25%කි.

ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ ශ්‍රී ලංකාව හා විදේශයන් අතර පැවති සම්බන්ධතාවල ස්වරූපය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීමට සකස් කළ මෙම ප්‍රශ්නය 71%ක් තෝරාගෙන ඇත. එහෙත් 65%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 9 හෝ ඊට අඩු ප්‍රමාණයකි. මෙහි (i)*A* හා (ii) *A* කොටස්වලට පිළිවෙළින් 85%ක් සහ 61%ක් වැනි වැඩි පහසුතා පෙන්වා ඇත. වැඩි පහසුතා පෙන්වීමට ඓතිහාසික වශයෙන් සිදුවීම් ගණනාවකට ත්‍රිකුණාමලය සම්බන්ධ වීමත් මෑත කාලීනව වැදගත් ස්ථානයන් වීමත් හේතුවී ඇත. ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ විදේශ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් පිළිබඳ විවිධ අවස්ථාවලදී සාකච්ඡාවට ලක්වී ඇති නිසා සාධනය ඉහළ මට්ටමක ඇත.

පහසුතා අඩුම මට්ටමක පවතින (i) *C* හා (ii) *B* අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 25%ක් හා 39%ක් වේ. ඓතිහාසික ස්ථාන පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීම ඊට හේතු වී ඇත. මෙවැනි සරල කරුණු පිළිබඳව අවධානයක් යොමු නොකිරීම හා වචනවල අර්ථය පිළිබඳව සැලකිලිමත් නොවීම ද හේතුවකි. ශ්‍රී ලංකාවේ ඓතිහාසික නැව් තොටු පිළිබඳව විවිධ තොරතුරු පහළ ශ්‍රේණිවල සිට අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබෙන නමුත් ගොඩවාය ඓතිහාසික නැව් තොට පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීම ප්‍රමාණවත් නැත.

ඈත අතීතයේ සිට වර්තමානය දක්වා පුරාණ නැව්තොටු හා වරායන් ආක්‍රමණ, සංක්‍රමණ, වෙළඳ ආදී වූ විවිධ සම්බන්ධතා පැවැත්වීමට හේතු වූ ආකාරය දැක්වෙන සේ වගු සකස් කර ප්‍රදර්ශනය කිරීම, ලෝක සිතියම් ඇසුරින් අනුරාධපුර, පොළොන්නරු යුගවල වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් පෙන්නුම් කිරීම හා එම රටවල් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කිරීම ප්‍රතිඵලදායක ය.

මෑත කාලීන තොරතුරු ඉවහල් කර ගනිමින් මෙම නැව් තොටෙහි වැදගත්කම මතු කර දැක්වීමට සිතියම් උපයෝගි කර ගැනීම, අතීතයේ මෙරටට ගෙන්වන ලද හා පිටරට යවන ලද භාණ්ඩ ලැයිස්තුගත කිරීම හා ආනයන, අපනයන වැනි වචනවල අර්ථයන් පිළිබඳ සිසුන්ට අවබෝධය ලබා දීම සුදුසු ය.

## 5 ප්‍රශ්නය

නිපුණතාව : පෘතුගීසින් හා ලන්දේසින් දේශිය පාලකයන් සමඟ පැවැත්වූ සම්බන්ධතා තුළනාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම.

**5.** (i) ඉන්දියානු සාගරය අවට රටවල වෙළෙඳ කටයුතුවල නිරත වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික සිදුවීම්වලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

*A* – පෘතුගීසීන්ගේ රූකඩයක් ලෙස කටයුතු කළ කෝට්ටේ අවසාන රජතුමා
*B* – පෘතුගීසින් ලංකාවට පැමිණෙන විට යාපනයේ සිටි පාලකයා
*C* – සීතාවක මායාදුන්නේ රජුට නාවුක ආධාර ලබා දුන් කැලිකට්හි පාලකයා
*D* – ක්‍රි.ව. 1602 දී පළමුවන විමලධර්මසූරිය රජතුමා හමුවීමට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා

(හත්වන විජයබාහු, සංකිලි, සැමොරින්, ජෝරිස් ෆන් ස්පිල්බර්ජන්, පරරාජසේකරම්, දොන් ජුවන් ධර්මපාල, සී බෝල්ඩ් ඩි වාට්) *(ලකුණු 04 යි)*

(iii) කෝට්ටේ හා යාපනය පාලන ප්‍රදේශවල පැවැති අභ්‍යන්තර දේශපාලන ආරවුල් නිසා පෘතුගීසින්ට එම ප්‍රදේශ තුළ සිය බලය තහවුරු කර ගැනීම පහසු වූ බව නිදසුන් **එක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iv) 'ලන්දේසින් හැමවිටම තම ආර්ථික වාසිය බලාපොරොත්තුවෙන් කටයුතු කළ බව පැහැදිලි වේ.' මේ බැව් වර්ෂ 1638 හා වර්ෂ 1766 ගිවිසුම්වල සඳහන් වගන්ති **එක** බැගින් උපයෝගී කර ගනිමින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i)
- ★ පෘතුගීසි/ ප්‍රතිකාල්වරු
- ★ ලන්දේසි/ ඕලන්ද
- ★ ඉංග්‍රීසි/ බ්‍රිතාන්‍ය
- ★ ප්‍රංශ

(ලකුණු 1 × 3 = 03)

(ii) *A* - දොන් ජුවන් ධර්මපාල
*B* - පරරාජසේකරම්
*C* - සැමොරින්
*D* - ජොරිස් ෆන් ස්පිල්බර්ජන්

(ලකුණු 1 × 4 = 04)

(iii)
- ★ ක්‍රි.ව. 1521 විජයබා කොල්ලය
- ★ හත්වන බුවනෙකබාහු හා මායදුන්නේ අතර ඇති වූ බල තරඟය
- ★ යාපනයේ පාලකයන් අතර ඇති වූ අභ්‍යන්තර ආරවුල්
- ★ පරරාජසේකරම් රජු මරා සංකිලි රජ වීම
- ★ පරරාජසේකරම් රජුගේ පුතා බලය ලබා ගැනීමට පෘතුගීසි සහය පැතීම
- ★ පෘතුගීසින් මෙම තත්ත්වයෙන් ප්‍රයෝජන ගැනීම

(ලකුණු 2 + 3 = 05)


(iv) 1638 ගිවිසුමේ කොන්දේසි
- ★ පෘතුගීසීන් පරාජය කිරීමේ යුද්ධය සඳහා යන සියලු වියදම් රජු විසින් දැරිය යුතුය.
- ★ ලන්දේසින්ට වෙළඳාමේ තනි අයිතිය හා වරායන් ලබා දිය යුතුය.

1766 ගිවිසුමේ කොන්දේසි
- ★ කොළඹ, ගාල්ල, මාතර, යාපනය දිසාවන් හා ත්‍රිකුණාමලය, මන්නාරම, කල්පිටිය වරායන් ද ලන්දේසීන්ට පවරා දිය යුතුය.
- ★ මුහුදුබඩ ගව්වක් පළල බිම් තීරුවක් ලන්දේසින්ට පැවරීම
- ★ කන්ද උඩරට වෙළඳාම, කුරුඳු තැලීම, ඇව දඬු කපා ගැනීමට රජු අවසර දිය යුතුය.


මෙම කොන්දේසි ලන්දේසින්ට වාසිවන ආකාරය සැකෙවින් විස්තර කිරීම අවශ්‍ය වේ.

(ලකුණු 4 + 2 = 06)

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 39%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 19%ක් වන අතර 35%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් හා අනු කොටස් 7ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (ii) *D* වන අතර එහි පහසුතාව 77%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iv) ය. එහි පහසුතාව 39%කි.

පෘතුගීසීන් හා ලන්දේසීන් දේශීය පාලකයින් සමඟ පැවැත්වූ සබඳතා තුලනාත්මකව විමසීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතය. 39%ක් පමණ තෝරාගෙන ඇති මෙම ප්‍රශ්නයේ එම පිරිස අතුරින් ලකුණු 10ට වඩා ලබාගැනීමට හැකිව ඇත්තේ 36%කට ය. 35%ක්ම ලබා ඇත්තේ ලකුණු 4 හෝ ඊට අඩුවෙනි. මෙම ප්‍රශ්නයට දී තිබුණු කොටස් හා අනුකොටස් අතරින් 5කම පහසුතා 59% සිට 77% තෙක් අගයන් ගෙන ඇත. එම (i) කොටසේ සහ (ii) හි *A*, *B*, *C* හා *D* අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 75%, 61%, 69%, 59% හා 77% වේ. ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතීන් පිළිබඳව, සිසුන් පෙර ශ්‍රේණිවලදීම දැනුවත් වීමත් (ii) කොටසේ වරහන් තුළින් පිළිතුරු තෝරා ලිවීමට සැලැස්වීමත් (i) හා (ii) කොටස් ලිවීමට අවශ්‍ය දැනුම සිසුන් තුළ තිබීමත් යන කරුණු ඉහළ පහසුතා ලැබීමට බලපා ඇත. තවදුරටත් එම සිද්ධීන් හා සම්බන්ධ තොරතුරු කියවීමට සැලැස්වීම ද පන්ති කාමරය තුළ සාකච්ඡා කිරීම ද යෝග්‍ය වේ.

(iii) හා (iv) කොටස්වලට පිළිවෙළින් 42%ක්, 39%ක් වැනි අඩු පහසුතා දක්වා ඇත්තේ පැහැදිලි කිරීම්වලදී දක්වන ලද දුර්වලතා බව ශිෂ්‍ය ප්‍රතිචාරවලින් දක්නට ලැබිණි. ගිවිසුම්වලට අදාළ වර්ෂ මතකයේ රඳවා නොගැනීම නිසා (iv) කොටසේ සාධනය පහත වැටීමට බලපා ඇත. අදාළ වර්ෂය සමඟ සෑම සිදුවීමක්ම සටහන් කර ගැනීමට ඉඩ සැලැස්වීම, යළි යළිත් එම ගිවිසුම් සම්බන්ධ කරන ආකාරයේ අභ්‍යාසවල යෙදවීම තුළින් සිසුන් දිරිමත් කළ හැකිය. ගිවිසුම්වලට අදාළ වර්ෂය සොයා සම්පූර්ණ කිරීමට ප්‍රහේලිකා වැනි විනෝද ක්‍රියාකාරකම්වල ද යෙදවිය හැකිය. එම ජාතීන්ගේ ක්‍රියාකාරකම් සංසන්දනය කිරීමේ අවස්ථා ද ඒවා ප්‍රදර්ශනය කිරීමෙන් ද මතකයේ රැඳවීම පහසුකළ හැකිය. වෙනත් ග්‍රන්ථ මගින් ලබා ගන්නා ඊට අදාළ කොටස් ඡායා පිටපත් කර සිසුන්ට ලබා දී ප්‍රශ්න හා පිළිතුරු සකස් කරවීම ද ප්‍රායෝගික ක්‍රියාකාරකමකි.

## 6 ප්‍රශ්නය

නිපුණතාව : ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ක්‍රියාත්මක වූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් විමර්ශනය කිරීමේ හැකියාව පිරික්සීම.

**6.** (i) පහත දක්වෙන ඒවා ශ්‍රී ලංකාවේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක වූයේදැයි අනුපිළිවෙළින් දක්වන්න.

*A* – විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම
*B* – ද්විමණ්ඩල ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කිරීම
*C* – ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කිරීම *(ලකුණු 03 යි)*

(ii) ශ්‍රී ලංකාව අත්පත් කරගැනීම කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීමට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) කෝල්බෲක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් සිදු කරන ලද පරිපාලනමය වෙනස්කම් **දෙකක්** සැකෙවින් දක්වන්න. *(ලකුණු 05 යි)*

(iv) බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් වතු වගාව නිසා මෙරට ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් **තුනක්** නිදසුන් ඉදිරිපත් කරමින් පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(6) (i) *A* - 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
*B* - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
*C* - 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව

(ලකුණු 1 × 3 = 03)

(ii)
- ★ ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
- ★ ත්‍රිකුණාමල වරායේ ස්වාභාවික පිහිටීම
- ★ ඉන්දියාවේ බටහිර හා නැගෙනහිර වෙරළේ නාවික බලය ලංකාවේ සිට පාලනය කළ හැකි වීම
- ★ වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබාගත හැකිවීම

(ලකුණු 2 × 2 = 04)


(iii)
- ★ උඩරට හා පහතරට ඒකාබද්ධ කර ඒකීය පාලනයකට යටත් කිරීම
- ★ සිවිල් සේවය ප්‍රතිසංවිධානය කිරීම
- ★ මුළු ලංකාවම පළාත් පහකට බෙදීම
- ★ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
- ★ පරිපාලන කටයුතු සඳහා දේශීය පුද්ගලයන් පුහුණු කර බඳවා ගැනීම

(ලකුණු 2 + 3 = 05)


(iv)
- ★ දේශීය කෘෂි කර්මාන්තය පිරිහීම
- ★ වෙළඳ බෝග, ආර්ථිකයේ ප්‍රමුඛස්ථානයක් ගැනීම
- ★ ආනයන අපනයන වෙළඳාම මත රටේ ආර්ථිකය හැඩ ගැසීම
- ★ නව රැකියා අවස්ථා ඇති වීම
- ★ ප්‍රවාහන හා සන්නිවේදන මාධ්‍ය දියුණු වීම
- ★ මුදල් භාවිතය දියුණු වීම
- ★ ස්වයං පෝෂිත ආර්ථිකය බිඳ වැටීම

(ලකුණු 3 + 3 = 06)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 42%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 27%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 40%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 18%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 15%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 15%ක් වන අතර 27%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් හා අනු කොටස් 6ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම කොටස (ii) වන අතර එහි පහසුතාව 81%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (i) *C* ය. එහි පහසුතාව 29%කි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ක්‍රියාත්මක වූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් විමර්ශනය කිරීමේ හැකියාව පිරික්සන මෙම ප්‍රශ්නය 42%ක් පමණ තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නය තෝරාගත් පිරිසෙන් 67%ක් 9 හෝ ඊට වඩා අඩු ලකුණු ලබා තිබේ. ප්‍රශ්නයේ (ii) කොටස පමණක් 81%ක පහසුතාව දක්වා ඇති අතර මෙහිදී ලංකාවේ පිහිටීමේ වැදගත්කම හා රටේ තිබෙන වෙළඳ ද්‍රව්‍ය පිළිබඳව සිසුන් මතකයේ තහවුරු කරගෙන සිටීම බලපා ඇත. එහිදී සඳහන් කළ යුත්තේ කරුණු දෙකක් බැවින් එය සම්පූර්ණ ලකුණු ලැබීමට හේතුවකි.

(i) *A* අනුකොටසට හා (iv) කොටසට 44% බැගින් පහසුතා පෙන්නුම් කළ ද එය සතුටුදායක සාධනීය මට්ටමක් සේ සැළකිය හැකිය. එක් එක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ වෙන් වෙන්ව මතක තබා ගැනීමට උනන්දු නොවීම හා (iv) කොටසට අදාළව පැහැදිලි කිරීම් දුර්වලතාව ලකුණු ලබා ගැනීම පහළ යාමට බලපා ඇත. (iii) කොටසෙහි ඊට අදාළ ප්‍රතිසංස්කරණ තුළින් පරිපාලන වෙනස්කම් තෝරා ගැනීමට අපොහොසත් වී ඇති බව පෙනේ. මෙහිදී “පරිපාලන” යන වචනයේ අර්ථය නොසළකා හැර ඇත. එමෙන්ම කරුණු වර්ග කිරීම පිළිබඳව ද දක්ෂතා ප්‍රදර්ශනය කර නැත. දේශපාලන, ආර්ථික, සංස්කෘතික කරුණු වෙන්ව හඳුනා ගැනීමට අදාළ ක්ෂේත්‍ර ඔස්සේ කරුණු වගුගත කළ හැකිය.

ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සියල්ලම එකම වගුවකට ගෙන සංසන්දනාත්මකව කරුණු සාකච්ඡා කිරීම, ඒ ඒ ව්‍යවස්ථාවල විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය පිළිබඳ වෙන වෙනම කරුණු සාකච්ඡා කිරීම තුළින් අවබෝධය පහසු කර විය හැකිය.

# III කොටස

## 7 ප්‍රශ්නය

**නිපුණතාව :** උතුරු ඉන්දියාවේ දේශපාලන හා සංස්කෘතික අභිවර්ධනය පිළිබඳ විශ්ලේෂණාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම

**7.** (i) *A* – අංග ජනපදය මගධයට ඈඳගැනීම
*B* – කාලිංග දේශය මෞර්ය අධිරාජ්‍යයට ඈඳගැනීම
*C* – වාහ්ලිකයන් පරාජය කර ඉන්දියාවෙන් පිටතට ගුප්ත අධිරාජ්‍යයේ බලය පැතිරවීම

ඉහත *A, B* හා *C* වලින් දක්වෙන එක් එක් සිද්ධිය හා සම්බන්ධ පාලකයා කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) පහත *D, E, F* හා *G* වලින් දක්වෙන එක් එක් කරුණට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*D* – චන්ද්‍රගුප්ත මෞර්ය රජුට සටන් කිරීමට සිදු වූ එවකට වයඹ දිග ඉන්දියාවේ සිටි ග්‍රීක පාලකයා
*E* – අශෝක අධිරාජයාගේ පාලන අගනුවර
*F* – හතරවන ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දක්වූ කුෂාණ රජතුමා
*G* – මේඝදූතය, සකුන්තලය, කුමාර සම්භවය වැනි සම්භාව්‍ය ග්‍රන්ථ රචනා කළ කවියා

(කාලිදස, පාටලීපුත්‍ර, තාම්‍රලිප්ති, සෙලියුකස් නිකේටර්, මහා ඇලෙක්සැන්ඩර්, කණිෂ්ක, වාල්මිකි) *(ලකුණු 04 යි)*

(iii) අශෝක අධිරාජයාගෙන් පසුව මෞර්ය අධිරාජ්‍යය පරිහාණියට පත්වීම කෙරෙහි බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) ගුප්ත යුගයේ ක්‍රියාත්මකව පැවැති අධ්‍යාපන ක්‍රමයේ විශේෂ ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(7) (i) *A* - බිම්බිසාර රජතුමා
*B* - අශෝක රජතුමා
*C* - දෙවන චන්ද්‍රගුප්ත රජතුමා

(ලකුණු 1 × 3 = 03)

(ii) *D* - සෙලියුකස් නිකේටර්
*E* - පාටලීපුත්‍ර
*F* - කණිෂ්ක
*G* - කාලිදාස

(ලකුණු 1 × 4 = 04)


(iii)
- ★ වයඹ දිගින් පැමිණි විදේශ ආක්‍රමණ
- ★ ප්‍රාදේශීය පාලකයන් බලවත් වීම
- ★ අශෝක රජුගෙන් පසු පැමිණි පාලකයන්ට විශාල අධිරාජ්‍යයක් පාලනය කළ නොහැකි වීම
- ★ යුද්ධය නිසා විශාල ආර්ථික පරිහානියක් සිදුවීම
- ★ රාජසභාවේ පැවති අභ්‍යන්තර ගැටුම්

(ලකුණු 2 + 3 = 05)


(iv)
- ★ අධ්‍යාපන ලැබීමේ අයිතිය සමාජයේ විශේෂ කොටස්වලට හිමි වීම
- ★ ගුරු ගෙදර මුල් කරගත් බ්‍රාහ්මණ අධ්‍යාපනය
- ★ බෞද්ධ උසස් අධ්‍යාපන ආයතන පැවතීම
- ★ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සැකසුණු විෂයමාලාව
- ★ බෞද්ධ ආරාමික අධ්‍යාපනය

(ලකුණු 3 + 3 = 06)

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 68%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 36%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 31%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 17%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 16%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 16%ක් වන අතර 36%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් හා අනු කොටස් 9ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම කොටස (ii) *F* වන අතර එහි පහසුතාව 78%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස් වන්නේ (i) *C* ය. එහි පහසුතාව 27%කි.

උතුරු ඉන්දියාවේ දේශපාලන, සංස්කෘතික අභිවර්ධනය පිළිබඳ විශ්ලේෂණාත්මකව විමසීම සඳහා සකස් කර ඇති මෙම ප්‍රශ්නය අපේක්ෂකයින් 67%ක් තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 9ට වැඩියෙන් 33%ක් ලබා ඇති අතර 67%ක් ලකුණු ලබා ඇත්තේ 9 හෝ ඊට අඩුවෙනි.

වැඩිම පහසුතා දක්වා ඇත්තේ (ii) *E*, (ii) *F* හා (ii) *G* අනුකොටස්වලට වන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 74%, 78% සහ 70% වේ. වරහන් තුළ පිළිතුරු සඳහන් කර තිබීම නිවැරදි පිළිතුරු පහසුවෙන් තෝරා ගැනීමට රුකුලක් වී ඇත. (ii) හි අනුකොටස් සඳහා ප්‍රශ්නය සකස් කර ඇති ආකාරය අනුව පහසුවෙන් නිවැරදි පිළිතුරු සැපයීමට හැකිවී ඇත. එක් එක් රජවරුන් පිළිබඳ සුවිශේෂී කරුණු වගුගත කර නිතර දකින්නට සැලැස්වීම, එක් එක් පාලකයාගේ චරිත ලක්ෂණ ඉස්මතු වන පරිදි බුද්ධි මණ්ඩල සාකච්ඡාමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිතුරු තෝරා ලිවීමේ අභ්‍යාස හුරු කරවීම, මතක ශක්තිය වැඩි දියුණු කිරීමට හේතු වේ.

පහසුතාව අඩුම (i) *C* අනුකොටස වන අතර එහි පහසුතාව 27%ක් වේ. මෙහිදී ඉන්දියාවේ ගුප්ත පාලකයන් පිළිබඳව සුවිශේෂී කරුණුවලට අවධානය යොමු වීම ප්‍රමාණවත් නැත. පාලකයින් සම්බන්ධ විශේෂිත සිදුවීම් කාඩ්පත් මගින් ගැළපීම වැනි ක්‍රියාකාරකම් දැනුම වර්ධනයට යොදා ගත හැකිය.

## 8 ප්‍රශ්නය

**නිපුණතාව :** මධ්‍යතන යුගයේ, යුරෝපයේ පුනරුද සමයේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික වෙනස්කම් පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

**8.** පස්වැනි සියවසේ සිට බටහිර යුරෝපයට එල්ල වූ ගෝත්‍රික ආක්‍රමණ හේතුකොටගෙන ඇති වූ දේශපාලන හෝ ආර්ථික අවුල්සහගත තත්ත්වය තුළින් වැඩවසම් ක්‍රමය බිහි විය.

(i) ක්‍රි.ව. නව වැනි ශතවර්ෂය පමණ වන විට බටහිර යුරෝපයේ දේශපාලන අස්ථාවරත්වයක් ඇතිවීම කෙරෙහි බලපෑ විදේශාක්‍රමණ එල්ල කළ කණ්ඩායම් **තුනක්** නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) මධ්‍යතන යුගයේ යුරෝපයේ පැවැති වැඩවසම් ක්‍රමයේ ආර්ථිකයෙහි විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) යුරෝපයේ වැඩවසම් ක්‍රමය පරිහානියට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) පුනරුද සමයේ
*A* – කලා ක්ෂේත්‍රය
*B* – විද්‍යා ක්ෂේත්‍රය
යන අංශ දෙකෙහි ප්‍රබෝධයක් හට ගත් බව නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(8) (i)
- වයිකිංවරු
- හන්වරු
- මුස්ලිම්වරු (ලකුණු 1 × 3 = 03)

(ii)
- ★ ඉඩම් භුක්තිය මත බැඳුනු ආර්ථික රටාව
- ★ ප්‍රවේණි ක්‍රමය පැවතීම
- ★ ස්වයංපෝෂිත ආර්ථික රටාව
- ★ වෙළඳාම භාණ්ඩ හුවමාරුව මගින් සිදුවීම
- ★ කට්ටිමාරු ක්‍රමය හා ශෂ්‍ය මාරු ක්‍රමය ඉඩම් වගාව සඳහා යොදා ගැනීම
- ★ සුළු වශයෙන් කර්මාන්ත පැවතීම
- ★ ජාතික රාජ්‍ය බිහිවීම
- ★ පුනරුදය (ලකුණු 2 × 2 = 04)


(iii)
- ★ කුරුස යුද්ධය
- ★ වෙළඳාමේ දියුණුව
- ★ ප්‍රවේණි ක්‍රමය බිඳ වැටීම
- ★ වසංගත රෝග
- ★ වෙළඳ නගර බිහිවීම
- ★ මුදල් භාවිතය
- ★ ජාතික රාජ්‍ය බිහිවීම
- ★ පුනරුදය (ලකුණු 2 + 3 = 05)

(iv) A - කලා ක්ෂේත්‍රය
- ★ පුනරුද සමයේ දී කලාව ආගමික මුහුණුවරින් මිදී ලෞකික මුහුණුවරක් ගැනීම
  - ● සාහිත්‍ය ප්‍රබෝධය
    - ★ ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ, ප්‍රැන්සිස් බේකන්, විලියම් ෂේක්ස්පියර් වැනි ලේඛකයන් බිහි වීම
  - ● චිත්‍ර කලාවේ ප්‍රබෝධය
    - ★ ලියනාඩෝ ඩාවින්චි, රෆායල් හා මයිකල් ආන්ජිලෝ වැනි චිත්‍ර ශිල්පීන්
    - ★ මොනාලිසා, අන්තිම රාත්‍රී භෝජනය වැනි නිර්මාණ, සිස්ටයින් දේවස්ථානයේ චිත්‍ර
  - ● මූර්ති කලාවේ ප්‍රබෝධය
    - ★ පීටා රුව හා ඩේවිඩ් ප්‍රතිමාව නිදසුන් වේ.
  - ● ගෘහ නිර්මාණ ශිල්පයේ දියුණුව
    - ★ ගොතික් ශෛලිය


B - විද්‍යා ක්ෂේත්‍රය

- ★ නිකලස් කොපර්නිකස් - සූර්ය කේන්ද්‍රවාදය
- ★ ජොහැන්නස් කෙප්ලර් - ග්‍රහ ලෝක හිරුවටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බව
- ★ ගැලීලියෝ ගැලලි - දුරදක්නය නිපදවීම
- ★ සර් අයිසෙක් නිව්ටන් - ගුරුත්වාකර්ෂණ නියමය
- ★ විලියම් හාවේ - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු
- ★ පැරසල්සස්ගේ සොයා ගැනීම්
- ★ ජොහැන්නස් ගුටන්බර්ග් - මුද්‍රණ යන්ත්‍රය
- ★ මයිකල් සර්වේස් - පෙනහළුවලින් රුධිරය පිරිසිදු කිරීම (ලකුණු 3 + 3 = 06)

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




8 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 39%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 34%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 27%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 19%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 20%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 20%ක් වන අතර 34%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් හා අනු කොටස් 5ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (iv) *A* වන අතර එහි පහසුතාව 72%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) වේ. එහි පහසුතාව 33%කි.

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ මධ්‍යතන යුගයේ පුනරුද සමයේ දේශපාලන ආර්ථික සමාජ හා සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා ය. මෙම ප්‍රශ්නය 39%ක් පමණක් තෝරාගෙන ඇත. 61%ක්ම ලකුණු ලබා ඇත්තේ ලකුණු 9 හෝ ඊට අඩුවෙනි. වැඩිම පහසුතාව 72%ක් (iv) A අනුකොටසට ලබා ඇත. අදාළ කලා කෘතීන් පිළිබඳව නොයෙක් විෂය ක්ෂේත්‍ර මගින් තොරතුරු ලැබීම හා මොනාලිසා වැනි ප්‍රචලිත කලාකෘති දක්නට ලැබීම මීට බලපා ඇත. ලෝක ප්‍රසිද්ධ කලා කෘතීන් පිළිබඳ තොරතුරු ලැයිස්තුගත කිරීම හා නිර්මාණ පිළිබඳ චිත්‍ර ප්‍රදර්ශනය වීමට සැලැස්වීම සුදුසු ය. අඩුම පහසුතාව දක්වා ඇත්තේ (i) කොටසටයි. එය 33%කි.

යුරෝපයට එල්ලවූ ගෝත්‍රික ආක්‍රමණ පිළිබඳ අවධානය අඩු වී ඇති නිසා, ආක්‍රමණික ජන කණ්ඩායම් නම් කිරීමට අපහසු වී ඇත. යුරෝපයට එල්ල වූ ආක්‍රමණික ජන කණ්ඩායම් ලැයිස්තුගත කර අධ්‍යයනය කිරීම සාධන මට්ටම ඉහළ නැංවීමට යෝග්‍ය උපක්‍රමයක් වනු ඇත.

## 9 ප්‍රශ්නය

**නිපුණතාව :** ඉන්දියාවේ දී බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්ති හා ඒවාට විරුද්ධව දේශීය නායකයන් කටයුතු කළ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය පිරික්සීම

**9.** (i) පහත *A, B* හා *C* වලින් දක්වෙන එක් එක් කරුණට අදළ පිළිතුර වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* – ක්‍රි.ව. 1498 දී ඉන්දියාවේ කැලිකට් නගරයට ගොඩබට පළමු පෘතුගීසි නාවිකයා

*B* – ක්‍රි.ව. 1876 දී කල්කටාවේ ඉන්දියානු සංවිධානය ආරම්භ කිරීම

*C* – ඉන්දියානු ජාතික කොන්ග්‍රසයෙන් ඉවත්ව ප්‍රගතිශීලී පිළ ගොඩනගමින් බ්‍රිතාන්‍යයන් ඉන්දියාවෙන් පළවා හැරීමට සේනා සංවිධානය කළ ජන නායකයා

(පර්ඩිනන්ඩ් මැගලන්, සුභාස් චන්ද්‍රබෝස්, සුරේන්ද්‍රනාත් බැනර්ජි, වස්කෝද ගාමා, බාල් ගංගාධාර් තිලක්)

(ලකුණු 03 යි)

(ii) *A* – ක්‍රි.ව. 1857 දී හටගත් සිපොයි කැරැල්ලට හේතු **දෙකක්** ද

*B* – එම කැරැල්ල අසාර්ථක වීමට හේතු **දෙකක්** ද වෙන් වෙන්ව සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉන්දියාවේ දී බ්‍රිතාන්‍යයන් විසින් අනුගමනය කරන ලද ඇතැම් ප්‍රතිපත්ති ඉන්දියානුවන් තුළ ජාතිකානුරාගය වර්ධනය කිරීමට හේතු වූ බව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉන්දියාවෙන් බ්‍රිතාන්‍යයන් එලවා දැමීම සඳහා මහත්මා ගාන්ධිතුමා අවිබලය වෙනුවට අහිංසාවාදී උපාය මාර්ග අනුගමනය කළ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(9) (i) *A* - වස්කෝද ගාමා

*B* - සුරේන්ද්‍රනාත් බැනර්ජි

*C* - සුභාෂ් චන්ද්‍රබෝස් **(ලකුණු 1 × 3 = 03)**

(ii) *A* - කැරැල්ලට හේතු

- ඉංග්‍රීසින් ඉන්දියාවේ ප්‍රදේශ ඈඳා ගැනීමේදී අනුගමනය කළ අත්තනෝමතික ප්‍රතිපත්තිය
- ඉන්දියානු නායකයින් නිගරුවට පත් කිරීම
- යටිතල පහසුකම් ඇති කිරීම නිසා ඉන්දියාවේ හුදකලා බව නැති වීම
- බ්‍රිතාන්‍ය පාලකයන් ක්‍රිස්තියානි මිෂනාරීන්ට උදව් දීම
- ඉන්දියාවේ සම්පත් බ්‍රිතාන්‍යයට ගෙන යාම උදා: කපු
- ඉන්දියානුවන්ගේ අවශ්‍යතා නොසලකා හැරීම
- ග්‍රීස් තවරන ලද පතරොම් පිළිබඳ කටකතාව

*B* - කැරැල්ල අසාර්ථක වීමට හේතු

- සැලැස්මක් නොමැති වීම
- සාමාන්‍ය ජනතාවගේ සහාය නොලැබීම
- ප්‍රභූවරුන් කැරැල්ලට සහය නොදීම
- පොදු අරමුණක් නොතිබීම
- බ්‍රිතාන්‍යයන්ගේ ආයුධ හා යුධ සංවිධාන ශක්තිය
- මනා නායකත්වයක් නොතිබීම **(ලකුණු 2 + 2 = 04)**

(iii)

★ බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ බදු ප්‍රතිපත්ති

★ ඉන්දියාවේ සම්පත් බ්‍රිතාන්‍යයට ගෙන යාම

★ කම්කරු ශ්‍රමය සූරා කෑම

★ ජනතා අවශ්‍යතා නොසලකා හැරීම

★ ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා යුරෝපා රටවල පැවති ජාතිකානුරාගී ව්‍යාපාර පිළිබඳ අවබෝධයක් ලැබීම


★ ඉංග්‍රීසි භාෂාව මගින් ඉන්දියාව තුළ ජාතික ඒකාබද්ධතාවක් ඇතිවීම

★ පුරා විද්‍යා කැනීම්වලින් ඉන්දියාවේ අතීත ශ්‍රී විභූතිය පිළිබඳ තොරතුරු හෙළි වීම හා ඒ තුළින් ඇති වූ අභිමානය


★ යටිතල පහසුකම් නිසා ඉන්දියානුවන් තුළ සබඳතා ඇඩි වීම **(ලකුණු 2 + 3 = 05)**

(iv) ★ සත්‍යාග්‍රහ ව්‍යාපාර
★ සහයෝගිතා වර්ජන ව්‍යාපාර
★ දේශීය භාණ්ඩ පරිහරණය දිරිමත් කිරීම හා අගය කිරීම
★ සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාර
★ "ඉන්දියාවෙන් ඉවත් වෙනු" ව්‍යාපාරය **(ලකුණු 3 + 3 = 06)**

**9 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




9 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 52%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 44%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 26%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 15%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 15%ක් ද, ලකුණු 14 හෝ ඊට වඩා වැඩියෙන් ලබාගත් පිරිස 15%ක් වන අතර 44%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට කොටස් හා අනුකොටස් 6ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (i) *A* වන අතර එහි පහසුතාව 82%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iii) යි. එහි පහසුතාව 34%කි.

ඉන්දියාව තුළ බ්‍රිතාන්‍යයන් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ද ඒවාට විරුද්ධව ඉන්දියානුවන් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග ද සම්බන්ධව සැකසී ඇති මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 52%කි. සාධන මට්ටම ලකුණු 10 හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත්තේ 30%ක් පමණ වන අතර 44%ක්ම ලබා ඇත්තේ ලකුණු 4 හෝ ඊට අඩුවෙනි.

(i) හි *A* හා *B* අනුකොටස් සඳහා පිළිවෙළින් 82%ක් හා 65%ක වැඩිම පහසුතා පෙන්වයි. වරහන් තුළ ඉදිරිපත් කරන ලද පිළිතුරුවලින් තෝරා ලිවීමට ප්‍රශ්නය සකස් වී තිබීමත් *A* හි අසා ඇති වස්කෝද ගාමා පිළිබඳව අවස්ථා කීපයකදීම සාකච්ඡා වීමත් ආසියාතික රටවල් අතරින් ඉන්දියාවේ ඉතිහාසයට වැඩි අවධානය යොමු වීමත් මීට හේතු වී ඇත. දේශ ගවේෂණ ව්‍යාපාර වැනි කරුණුවලට සිසුන්ගේ රුචිකත්වය ඉහළ මට්ටමක පැවතීම ද බලපා ඇත.

අඩුම පහසුතා පෙන්වන්නේ (i) හි *C* අනුකොටසට හා (iii) කොටසට වන අතර එය පිළිවෙළින් 40% හා 34% වේ. ශිෂ්‍ය ප්‍රතිචාර තුළින් ද පුද්ගලයින් හා සම්බන්ධ වැදගත් තොරතුරු පිළිබඳව අඩු දැනුම පිළිබිඹු වන අතර ඉන්දියානු ඉතිහාසයට සම්බන්ධ පුද්ගල නාම රාශියක් තිබීමත් ඒවා තෝරා ගැනීම අපහසුවීමත් අවම පහසුතා ලබා ගැනීමට හේතුව විය හැකිය. (iii) කොටසේදී බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති ජාතිකානුරාගය වර්ධනය සඳහා බලපෑම පිළිබඳ කරුණු සම්බන්ධ කර ඉදිරිපත් කිරීමට හා විස්තර කිරීමට දුර්වලතා පෙන්වීම ලකුණු අඩුවීමට බලපා ඇත. කරුණු වෙන් වෙන් වශයෙන් ගොනු කිරීම, කරුණු අතර සබඳතා පෙන්වන ද්විත්ව ජර්නල සටහන් සකස් කිරීම හා ඒවා භාවිතය තුළින් සමස්තය ගොඩ නැඟීම, පුද්ගලයින් හා කාර්යයන් වගුගත කොට සම්බන්ධ කිරීම, කරුණු විස්තර කිරීමට පුහුණුව ලබාදීම සඳහා අභ්‍යාස කරවීම ප්‍රතිඵල දායකය. දේශානුරාගී ක්‍රියාමාර්ගවලට සම්බන්ධ පුද්ගලයින්ගේ පින්තූර ප්‍රදර්ශනය කිරීම ද වැදගත් ය.

## 10 ප්‍රශ්නය

**නිපුණතාව :** ටොකුගාවා යුගයේ සිට දෙවන ලෝක මහා සංග්‍රමය පැවති කාල වකවානුව දක්වා ජපානය මුහුණදුන් දේශපාලන හා ආර්ථික ක්‍රියාවලින් විමර්ෂනය කිරීමේ හැකියාව පිරික්සීම

**10.** (i) ටොකුගාවා පාලන සමයේ දී ජපානය සමඟ වෙළෙඳ සම්බන්ධතා පැවැත් වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) පහත *A, B, C* හා *D* වලින් දැක්වෙන එක් එක් කරුණට අදළ පිළිතුර වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* – ජපානයේ වැඩවසම් යුගයේ දී ඉහළ සමාජ මට්ටමක සිට, ටොකුගාවා පාලන සමයේ දී පහළ මට්ටමකට පත් වූ පිරිස

*B* – මෙයිජි පාලන සමයේ ජපානයේ පාලන මධ්‍යස්ථානය

*C* – දෙවන ලෝක යුද්ධයේ දී ජපානය යටත් වීමේ ගිවිසුමට අත්සන් කළ අවස්ථාවේ මිත්‍ර පිල නියෝජනය කළ ජනරාල්වරයා

*D* – සැන්ප්‍රැන්සිස්කෝ සමුළුවේ දී, ජපානයට දඩුවම් නොකිරීමට සෙසු ජාතීන් කැමති කරවා ගත් ශ්‍රී ලාංකික නියෝජිතවරයා

(මැක් ආතර්, සමුරායිවරු, ඒඩෝ, ශ්‍රීමත් ජෝන් කොතලාවල, ඩයිමියෝවරු, ජේ. ආර්. ජයවර්ධන, කියෝතෝ, හැරිස් ටවුන්සෙන්ඩ්) *(ලකුණු 04 යි)*

(iii) මෙයිජි පාලන සමයේ දී ජපානයේ ඇති වූ කර්මාන්ත දියුණුවේ විශේෂ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) *A* පළමුවන ලෝක මහා සංග්‍රාමයට පෙර සමයේ හා *B* දෙවන ලෝක මහා යුද සමයේ දී ජපානය තම බල ව්‍යාප්තිය සිදු කළ ආකාරය, නිදසුන් දක්වමින් පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(10) (i)
- පෘතුගීසි
- ස්පාඤ්ඤ
- ලන්දේසි
- ඉංග්‍රීසි

(ලකුණු 1 × 3 = 03)

(ii) *A* - සමුරායිවරු
*B* - ඒඩෝ
*C* - මැක් ආතර්
*D* - ජේ.ඒ. ජයවර්ධන

(ලකුණු 1 × 4 = 04)

(iii)
- ★ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම (මිට්ෂුයි හා මිට්ෂුබිෂි)
- ★ නිෂ්පාදන ධාරිතාව ඉහළ යාම
- ★ දියුණු තාක්ෂණය භාවිතා කිරීම
- ★ කුඩා පරිමාණයේ කර්මාන්තශාලා රාශියක් තිබීම
- ★ බැර කර්මාන්ත සඳහා රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද සම්බන්ධ වීම
- ★ කර්මාන්ත සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම


(ලකුණු 2 + 3 = 05)

(iv) *A* - පළමුවන ලෝක මහා සංග්‍රාමයට පෙර
- ක්‍රි.ව. 1895 දී චීනය අභිබවා කොරියාවේ බලය පිහිටුවීමට ජපානය සමත් වීම
- ක්‍රි.ව. 1904 දී රුසියන් ජපන් යුද්ධයෙන් පසු සඛාලින් දූපතේ දකුණු කොටස අල්ලා ගැනීම
- ක්‍රි.ව. 1910 දී රාජ්‍ය තාන්ත්‍රික සබඳතා මගින් කොරියාව යටත් කර ගැනීම


*B* - දෙවන ලෝක යුධ සමයේ
- ක්‍රි.ව. 1941 දී පර්ල් වරායට පහර දීම
- තායිලන්තය, මලයාසියාව, සිංගප්පූරුව, බුරුමය හා හොංකොං අල්ලා ගැනීම
- සුමාත්‍රා, ජාවා, බෝර්නියෝ හා පිලිපීනය යටත් කොට ගැනීම
- ලංකාවට ද ප්‍රහාර එල්ල කිරීම

(ලකුණු 4 + 2 = 06)

**10 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




10 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 32%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ. ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 65%ක් ද, ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 27%ක් ද, ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 6%ක් ද, ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 2%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 2%ක් වන අතර 65%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 හෝ ඊට අඩුවෙනි.





මෙම ප්‍රශ්නයට කොටස් හා අනුකොටස් 7ක් ඇත. ඒවා අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (ii) *C* වන අතර එහි පහසුතාව 90%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iv) ය. එහි පහසුතාව 12%කි.

ටොකුගාවා යුගයේ සිට දෙවන ලෝක සංග්‍රාමය පැවති කාල වකවානුව දක්වා ජපානය මුහුණ දුන් දේශපාලන හා ආර්ථික ක්‍රියාවලීන් විමර්ශනය කිරීම සඳහා මෙම ප්‍රශ්නය සකස් වී ඇත. මෙය සියලුම ප්‍රශ්න අතරින් තෝරා ගැනීම අඩුම ප්‍රශ්නය වන අතර එය 32%කි. එමෙන්ම පිළිතුරු දී ඇති අයගෙන් 92%ක්ම ලබා ඇත්තේ ලකුණු 9 හෝ ඊට අඩු ප්‍රමාණයකි. සමස්තයක් ලෙස මෙම ඒකකයට දරුවන් ප්‍රිය නොකිරීම හා බාහිර තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර හිඟ වීම ප්‍රශ්නය තෝරා ගැනීම අවම වීමට බලපා තිබේ. වැඩිම පහසුතාව පෙන්වන්නේ (ii) හි *C* අනුකොටසයි. එය 90%කි. යුද්ධයේ බිහිසුණු බව හා විනාශය සමග යුද්ධයේ අවසානයට වැඩි අවධානයක් යොමු කර ඇති බැවින් එම සිදුවීම හා පුද්ගලයා පිළිබඳ මතකයේ රැඳී පැවතීම ඊට හේතු වී ඇත. පහසුතාව අඩුම වන්නේ (iii) හා (iv) කොටස් සඳහා ය. එය පිළිවෙළින් 16%හා 12% වේ. ජපානය හා චීනය පිළිබඳව තොරතුරු ජනප්‍රිය නොවීම සාධන මට්ටම අඩු වීමට හේතු වන්නට ඇත.

මෙම රටවල් පිළිබඳ කරුණු ඉගැන්වීමේදී ඉගෙනුම් උපකරණ වශයෙන් පින්තූර, පත්‍රිකා, සීඩී තැටි භාවිත කරමින් මතකයේ රැඳෙන පරිදි ඉගැන්වීම, ඒ ඒ පාලන කාලවලදී විවිධ පුද්ගලයින් සම්බන්ධ සිදුවීම්, අදාළ රටවල් හා සම්බන්ධ කර ගැළපීමේ අභ්‍යාස කරවීම, පුද්ගලයින් පිළිබඳ කෙටි ප්‍රශ්න සකස් කරවීම, තොරතුරු ගවේෂණයට යොමු කිරීම කුඩා පොත් සකස් කරවීම, කරුණු විස්තර කිරීමේ අභ්‍යාසවලට යොමු කිරීම ආදිය මඟින් සාධන මට්ටම ඉහළ නැංවීම කළ හැකිවේ.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




**I කොටස**

පළමු ප්‍රශ්නය I කොටසට අයත් වන අතර එය අනිවාර්ය වේ. මෙම ප්‍රශ්නය සකස් වී ඇත්තේ (අ) (i), (ආ) (i) හි, *A*, *C* සහ (ii), (iii) කොටස් ලංකා ඉතිහාසයට ඇතුළත්වන ලෙසත් (අ) (ii) හා (ආ) (i) හි *B* හා *D* ලෝක ඉතිහාසයට ඇතුළත් වන ලෙසත් ය. මෙම කොටසට දක්වා ඇති පහසුතාව ලංකා ඉතිහාසය 30%ක් හා ලෝක ඉතිහාසය 12%ක් වේ.

ලංකා ඉතිහාසය ආශ්‍රිතව ඉදිරිපත් කොට ඇති ප්‍රශ්න අතරින් වැඩිම පහසුතාව දක්වා ඇත්තේ මහා වංශය ආශ්‍රිතව හා පොළොන්නරු යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ ආශ්‍රිතව ඉදිරිපත් කළ ප්‍රශ්නවලටය. එයට හේතුව ඒවා සිසුන් අතර ජනප්‍රියවීම නිසා විය හැකිය. එසේ නමුත් සමස්තයක් ලෙස ගත් විට සිතියම් ලකුණු කිරීම දුර්වල මට්ටමක ඇත. එය ලංකා සිතියම 24%ක් සහ ලෝක සිතියම 15%ක් වැනි අඩු මට්ටමකි. සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා පින්තූර හඳුනා ගැනීමට කෙටි ප්‍රශ්න සකස් කරවීම පුද්ගලයන් හා ඔවුන් සම්බන්ධ තොරතුරු රැස් කරවීම, නිවැරදි ශිල්පීය ක්‍රම භාවිත කරමින් භෞතික ලක්ෂණ හා සංස්කෘතිකමය වශයෙන් වැදගත් ස්ථාන සිතියම්වල ලකුණු කර ප්‍රදර්ශනය කිරීම සුදුසු ය. සිතියම් ලකුණු කිරීමේ අභ්‍යාසවල නිරත කරවීම නිතර සිදුකිරීම අවශ්‍ය වේ.

**II කොටස**

ශ්‍රී ලංකා ඉතිහාසයට අදාළ II කොටසට ප්‍රශ්න 5ක් ඇත. පිළිතුරු සැපයිය යුත්තේ ඉන් ප්‍රශ්න 3 කට ය. මෙහි දී ප්‍රශ්න තෝරා ගැනීම 2 ප්‍රශ්නයට 83%ක් ද, 3 වැනි ප්‍රශ්නයට 62%ක් ද, 4 වැනි ප්‍රශ්නයට 71%ක් ද, 5 වැනි ප්‍රශ්නයට 39%ක් ද හා 6 වැනි ප්‍රශ්නයට 42%ක් ද ආදී වශයෙනි. වැඩිම තෝරා ගැනීමක් ඇත්තේ 2 වැනි ප්‍රශ්නයයි. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ දේශපාලන ආර්ථික සංස්කෘතික යන අංශ පිළිබඳව පහළ ශ්‍රේණිවල දී දැනුම ලැබී තිබීම වැඩි තෝරා ගැනීමට බලපා ඇත.

මෙම කොටසින් අඩුම තෝරා ගැනීමක් ඇත්තේ 5 වැනි ප්‍රශ්නයයි. එය 39% කි. බටහිර ජාතීන්ගෙන්ගේ පාලනය පිළිබඳ තොරතුරු මැනවින් ග්‍රහණය කර නොගැනීම වැඩි දෙනෙක් මෙම ප්‍රශ්නය අතහැරීමට හේතු වී ඇත. මේ සඳහා බටහිර ජාතීන්ගේ පාලන තොරතුරු ජාතීන් වශයෙන් හා දේශපාලන, සංස්කෘතික, ආර්ථික වශයෙන් ද වෙන් කර ලබා දීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී භූමිකා රංගන වැනි ක්‍රමවේද භාවිත කිරීම සංකල්ප සිතියම් මගින් සමස්තය දැකීමට සැලැස්වීම සුදුසු ය. පෙළපොත භාවිත කිරීමට හා බාහිර කරුණු ගවේෂණයට යොමු කළ හැකි ය.

**III කොටස**

III කොටස සකස් වී ඇත්තේ ප්‍රශ්න 4කිනි. එම ප්‍රශ්න උතුරු ඉන්දියාවේ දේශපාලනය හා සංස්කෘතික තොරතුරු යුරෝපයේ මධ්‍යතන යුගයේ හා පුනරුද සමයේ දේශපාලන, ආර්ථික හා සමාජමය වෙනස්කම්, ඉන්දියාවේදී බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්ති, ජපානය දෙවන ලෝක සංග්‍රාම අවදියේ මුහුණදුන් දේශපාලන හා ආර්ථික ක්‍රියාවලි ඇසුරින් සකස් වී ඇත.

ප්‍රශ්න තෝරා ගැනීම පිළිබඳව සැලකීමේදී 7 වන ප්‍රශ්නය තෝරා ගැනීම 67% කි. එය ඉන්දියාව ඇසුරින් සකස් වී ඇත. ඉන්දියාව හා අප රට අතර පවතින සම්බන්ධතාව නිසා මේ මාතෘකාව සිසුන් අතර ජනප්‍රියය. ඒ නිසාම ඉහළ ප්‍රතිචාර දක්වා ඇත. යුරෝපා ඉතිහාසය හා ජපානය සම්බන්ධ ප්‍රශ්නවලට සිසුන්ගේ ප්‍රතිචාර සතුටුදායක නොවේ.

ජපානය හා සම්බන්ධ බාහිර තොරතුරු ලබා ගැනීමේ අසීරු බව හේතුවකි. සමස්තයක් වශයෙන් ගත් කල්හි ඉන්දියාව හැරුණු විට ලෝක ඉතිහාස මාතෘකාවලට දක්වා ඇති පහසුතා සතුටුදායක නැත. රටවල් පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා වෙනත් පොත් පත් පරිශීලනයට යොමු කිරීම, වර්තමාන තොරතුරු එක් රැස් කිරීම, කුඩා පොත් සකස් කිරීම, එම රටවල් හා වර්තමානයේ අපේ රට අතර පවතින සම්බන්ධතා පිළිබඳව දැනුවත් කිරීම ආදී ක්‍රියාකාරකම්වලට සිසුන් යොමුකළ හැකි ය.

## III කොටස

# 3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

## 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
- ⋆ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.
- ⋆ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ⋆ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ⋆ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ⋆ ප්‍රශ්න අංක, කොටස් අංක හා අනුකොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.
- ⋆ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ⋆ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- ⋆ නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, අමතර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතුය.

**විශේෂ උපදෙස් :**

- ⋆ සිතියම් ලකුණු කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :
  - නගර ලකුණු කිරීමේ දී නිවැරදි ස්ථානය පැහැදිලිව තිත් ලකුණක් යොදා නම් කිරීම
  - රාජධානි හා වැව් ලකුණු කිරීමේ දී නිවැරදි ප්‍රදේශය අඳුරු කර නම් කිරීම
  - ගංගා සහ කඳුවැටි ලකුණු කිරීමේ දී නිවැරදිව හඳුනාගත හැකිවන ලෙස නම් කිරීම
- ⋆ අසා ඇති ප්‍රශ්නවලට උචිත පරිදි පිළිතුරු ගොනු කර ඉදිරිපත් කිරීම
- ⋆ කරුණු දැක්වීම හා ඒවා පැහැදිලි කිරීම, විස්තර කිරීම හෝ සනාථ කිරීම අනුව ප්‍රශ්නවල ලකුණු බර තබා ඇති බව තේරුම් ගැනීම
- ⋆ ව්‍යුහගත රචනා වර්ගයේදී නිදසුන් හා සාධක ඉදිරිපත් කළ යුතු වීම
- ⋆ අනුමාතෘකා සඳහා පිළිතුරු, ඡේද අනුව වෙන් කළ යුතු වීම

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

★ ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා

- ඉගෙනුම් ආධාරක භාවිත කිරීම
- විෂය ක්‍රියාකාරකම් ප්‍රබෝධ ජනක අයුරින් සංවිධානය කිරීම
- සැලසුම් කරන ලද ක්ෂෙත්‍ර චාරිකා සංවිධානය කිරීම
- විශේෂයෙන්ම පෙළපොත පරිහරණය සඳහා යොමු කිරීම
- සිසු නිර්මාණ (විෂයයට අදාළ) පන්තියේ ප්‍රදර්ශනය කිරීම ( බිත්ති පුවත්පත්, සඟරා, ප්‍රහේලිකා, කෙටි ප්‍රශ්න හා පිළිතුරු සංග්‍රහ සකස් කිරීම)
- ඉතිහාසය විෂයය සඳහා කාමරයක්/ ප්‍රදේශයක් වෙන් කර සංවර්ධනය කිරීම
- විවෘත ග්‍රන්ථ පරීක්ෂණවලට යොමුකොට කරණු ගවේෂණය කිරීම
- ආධාරක වශයෙන් නිවැරදි සිතියම් භාවිත කිරීම හා සිතියම් සංග්‍රහ සකස් කරවීම
- පිළිතුරු ලිවීමේ දී කරුණු සංවිධානය, ප්‍රගුණ කිරීමේ අභ්‍යාස කරවීම
- ගමෙහි/ ප්‍රදේශයෙහි/ රටෙහි ඓතිහාසික ස්ථාන හා සිදුවීම් ජනප්‍රවාද ඇසුරෙන් සොයා බැලීමට යොමු කිරීම
- රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත්වල අධ්‍යාපනික වැඩසටහන් සාකච්ඡා සහ ලිපිවලින් තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.
  (නිද - මහා සංචාරේ, වන්දනා)
- ප්‍රවීන දේශකයන්ගේ උදව් උපකාර ලබා ගැනීම
- බුද්ධි මණ්ඩල සාකච්ඡා, විවිධ පාසල් තුළ හා පාසල් අතර සංවිධානය